# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk
ශ්‍රී බුද්ධ වර්ෂ 2567 ක් වූ වෙසක් අව අටවක පෝදා 2023 මැයි 12 සිකුරාදා BUDUSARANA FRIDAY MAY 12, 2023
ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 45 පත්‍රය , ආරම්භය 1965 - 06 - 13



ත්‍රිකුණාමලය
ආනන්දගම තිස්ස රාජමහා විහාරයේ
බුද්ධ ප්‍රතිමා වහන්සේ

ඡායාරූපය -
නිශ්ශංක විජේරත්න



# සියලු සංස්කාර ධර්මයෝ නැසෙන සුළු බව පසක් කරමින්

## සම්බුදු පියාණෝ පිරිනිවනට වැඩි සේක

**බුදුරජාණන් වහන්සේගේ අවසාන වස් කාලය බේලුව නම් ගමෙහිදී සිදු විය. එහිදී දරුණු රෝගයක් වැළඳිණි. බලවත් චිත්ත ධෛර්යයකින් යුතුව එම වේදනාව ඉවසූ සේක.**

භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයාට කිසිවක් නොවදාරා පිරිනිවන් නොපාන සේකැයි සැනසුම් සුසුමක් හෙළිය හැකි වූයේ දැන් යැයි අනඳ තෙරණුවෝ පැවසූහ. එවිට බුදුරජාණන් වහන්සේ

“ආනන්ද සියලුම දේ දේශනා කරන ලදී. මා ළඟ ගුරු මුෂ්ටියක් තබාගෙන නැත. ආනන්ද භික්ෂු සංඝයා පාලනය කරමි'යි කියා, හෝ භික්ෂු සංඝයා මා නිසා ජීවත් වෙතියි කියා හෝ අදහසක් මා තුළ නැත.”

“ආනන්ද, මම අසූ වයස් වූ දිරාපත් වූ මහල්ලෙක් වෙමි. දිරාපත් වූ කරත්තයක් සැලෙන්නේ යම් සේ ද මාගේ ශරීරය ද එබඳු ම ය. ආනන්ද තමාට තමා ම පිහිට කොටගෙන, තමා ම සරණ කොට ගෙන, ධර්මය පිහිට කොට ගෙන, ධර්මය ම සරණ කොටගෙන ජීවත් වෙන්න. අන් සරණක් නැත.”

පසුදිනක විසාලා මහනුවර පිඬු සිඟා වළඳා ආනන්ද තෙරණුවන් සමඟ චාපාල චෛතිය නම් ස්ථානයට වැඩි සේක.

“ආනන්ද විසාලා මහනුවර රමණීයයි. උදේන චෛතිය රමණීයයි. ගෝතම චෛතිය රමණීයයි. සත්තම්බ චෛතිය රමණීයයි.”

“ආනන්ද සතර ඍද්ධිපාද මැනවින් ප්‍රගුණ කළ කෙනකුට කැමති නම් මේ ආයු කල්පය හෝ ඊටත් මදක් වැඩියෙන් හෝ ජීවත්වීමට පිළිවන. තථාගතයන් වහන්සේ සතර ඍද්ධිපාද වඩා ඇති හෙයින් ඒ සඳහා සමත් වන සේක.”

බුදුරජාණන් වහන්සේ පැවසූ දෙය ගැන අනඳ තෙරණුවෝ සැලකිල්ලක් නොදැක්වීමෙන් තුන් මසකින් පසු පිරිනිවන් පෑමට තීරණය කළහ. පසුව ආනන්ද තෙරණුවන් කළ ඉල්ලීම ප්‍රතික්ෂේප කළහ.

“මහණෙනි, මා අවබෝධ කොටගෙන දෙසූ ධර්මය මැනවින් ඉගෙන, ලෝකයාගේ දෙව් මිනිසුන්ගේ හිතසුව පිණිස බුදුසසුන චිරස්ථායි වන සේ කටයුතු කරන්න. මහණෙනි, තථාගතයන් වහන්සේ තව නොබෝ කලකින් එනම් තුන් මසකින් පිරිනිවන් පාන සේක. සියලු සංස්කාර ධර්ම නැසෙන සුළුයි. නොපමාව කුසල් දහම් කර ගන්න.”

භාණ්ඩ ගමට වැඩි බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට සීල, සමාධි,ප්‍රඥා, විමුක්ති යන සතරෙහි අගය වදාළ සේක. හස්තිගාම, අම්බගාම, ජම්බුගාම, භෝග නගර යන ගම් පසුකරමින් භෝග ග්‍රාමයේ දී සතර මහෝපදේශ දේශනා කළහ.

පාවා නුවර දී චුන්දකර්මාර පුත්‍රයාගේ නිවසේ දී සූකරමද්දව නම් විශේෂ ආහාරයක් සමඟ දන් වැළඳීමෙන් පසු ලෝහිත පක්ඛන්දිකා නම් ලේ අතීසාරය රෝගය යළිත් මතු විය. ආනන්ද තෙරුන් සමඟ කුසිනාරාවාට වඩින අතරතුර දැඩි වෙහෙසක් සමඟ දැඩි පිපාසයක් ද ඇති විය. ගසක් මුල වැඩ සිට

“ආනන්ද බොහෝම පිපාසයි. පැන් ටිකක් සොයාගෙන එන්න” ආනන්ද තෙරුන් කුඩා නදියකින් පැන් ගෙනවුත් පිළිගැන්වූහ. අතරමඟ දී පුක්කුසාති නම් මල්ල රටවැසි තරුණයකු උන්වහන්සේ සමඟ කථා කොට සිවුරු දෙකක් පිළිගැන්වීය. එයින් එක් සිවුරක් ආනන්ද තෙරුන් විසින් බුදුරදුන්ට පෙරවූහ. පසුව කකුද නම් නදියට බැස සිරුර දෝවනය

> **“ආනන්ද, සියලු ප්‍රිය මනාප දෙයින් වෙන්වීමට සිදු වන බව මා කල් ඇතිවම කියා තිබෙනවා නොවේ ද? ශෝක නොකරන්න. තථාගතයන් වහන්සේගේ ශරීරය වුව ද, අනිත්‍ය වේ. මට දිගු කලක් ඉතා හිතවත්ව උපස්ථාන කිරීමෙන් ඔබට ඉමහත් පිනක් රැස්කර ගැනීමට හැකි විය. ආනන්ද ඔබ පින් කළ කෙනෙක්. ඉතා ඉක්මනින් ඔබට රහත්වීමට පුළුවන්.” කියා ආනන්ද තෙරුන්ගේ ගුණ වර්ණනා කළ සේක.**

කොට අසල තිබූ අඹ වනයට වැඩියහ. දැඩි ක්ලාන්ත ගතිය නිසාම ගසක් මුල බිම සඟල සිවුර අතුරුවා සැතපුණ සේක.

ඉන්පසුව බුදුරජාණන් වහන්සේ කුසිනාරා නුවර උපවත්තන නම් සල් උයනට වැඩම කළ සේක.

“ ආනන්ද දැඩි ක්ලාන්ත ගතියක් දැනෙයි. සැතපීමට මේ සල්ගස් දෙක අතර, උතුරට හිසලා ආසනයක් පිළියෙල කර දෙන්න.” පිළියෙල කළ ආසනයේ බුදුරජාණන් වහන්සේ සැතපුණු සේක. සල්වනය මලින් ගැවසී ගත්තේ ය. මල් රේණු, මල් පෙති, බුදු පුදට මෙන් උන්වහන්සේගේ සිරුර මත වැටෙයි. දෙවියෝ ද මල් විසුරවමින් පූජා පවත්වන්නට විය. එහිදී

“ආනන්ද, මේ සල්ගස් අකාලයෙහි පිපුණු මලින් ගැවසී ගෙන ඇත. මල් රේණු, මල් පෙති, ඔබ මොබ වැටෙයි. මගේ සිරුර මත ද වැටෙයි. දෙවියෝ ද මලින් පූජා පවත්වති. ආනන්ද, මට මෙසේ බාහිර පූජා පැවැත්වීම නියම පූජාවක් නොවේ. යම් කෙනකු ධර්මයට අනුව හැසිරේ නම් එම ප්‍රතිපත්ති පූජාව මට කරන උසස්ම පූජාවයි. ආනන්ද එම ප්‍රතිපත්ති පූජාවෙහි යෙදෙන්න.

සංවේගයෙන් පසුවන භික්ෂූන් අමතා මෙසේ වදාළ සේක.

“මහණෙනි, සැදැහැවත් කුල පුත්‍රයකු විසින් දැක සංවේග උපදවා ගත යුතු තැන් හතරකි. තථාගතයන් වහන්සේ උපන් තැන, බුදුවූ තැන, දම්සක් පැවැත්වූ තැන, පිරිනිවන් පෑ තැන යනු ඒ සතරයි. අනඳ තෙරණුවෝ මට තවමත් රහත්වීමට නොහැකි විය. මා කෙරෙහි දයාවෙන් යුත් බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පානා සේක. දැන් මට කවර පිහිටක් ද? යනුවෙන් කියමින් හඬන්නට වූහ. බුදුරජාණන් වහන්සේ ඒ බව දැන


“ආනන්ද, සියලු ප්‍රිය මනාප දෙයින් වෙන්වීමට සිදු වන බව මා කල් ඇතිවම කියා තිබෙනවා නොවේ ද? ශෝක නොකරන්න. තථාගතයන් වහන්සේගේ ශරීරය වුව ද, අනිත්‍ය වේ. මට දිගු කලක් ඉතා හිතවත් ව උපස්ථාන කිරීමෙන් ඔබට ඉමහත් පිනක් රැස්කර ගැනීමට හැකි විය. ආනන්ද ඔබ පින් කළ කෙනෙක්. ඉතා ඉක්මනින් ඔබට රහත්වීමට පුළුවන්.” කියා ආනන්ද තෙරුන්ගේ ගුණ වර්ණනා කළ සේක.

ආනන්ද තෙරුන් මල්ල රජ දරුවන් රැස් කරවා අද රාත්‍රී පශ්චිම යාමයෙහි තථාගතයන් වහන්සේ පිරිනිවන් පානා සේක. පමා වී පසුතැවිල්ලට පත් නොවන්න. වහා එහි ගොස් උන්වහන්සේ දැක ගන්න. ඒ ඇසූ මල්ල රජ දරුවන් හඬ,හඬා වැලපි වැලපී, උපවත්තන සල් උයනට ඉතා ඉක්මනින් ගියහ.

කුසිනාරාවෙහි විසූ සුභද්‍ර නම් පරිබ්‍රාජකයාට බුදුරදුන් එදින පිරිනිවන් පාන බව සැලවිය. බුද්ධෝත්පාද කාලයක වටිනාකම අසා දැන සිටි ඔහු තමන්ට ඇති ගැටලු කිහිපයක් අසා දැන ගන්නට සිතා අනඳ හිමියන් මුණ ගැසුණ ද බුදුරජාණන් වහන්සේගේ විවේකයට සිදුවන බාධා ගැන සිතා එයට ඉඩ නොදුන් අතර, බුදුරජාණන් වහන්සේට දෙදෙනාගේ කථාව ඇසුණහ.

“ආනන්ද සුභද්‍රට මා වෙත එන්නට ඉඩ දෙන්න. ඔහු පැමිණ ඇත්තේ මා වෙහෙසන්නට නොවේ. මගෙන් කරුණු විමසා දැන ගැනීමටයි. මා විසඳා දෙන කරුණු වහා අවබෝධ කර ගැනීමට සුභද්‍ර සමත්. අනඳ තෙරණුවෝ සුභද්‍රට බුදුරදුන් වෙත යෑමට ඉඩ දුන්හ. ඔහු විසඳාගත යුතු ගැටලුවලට විසඳුම් ලබා ගත් අතර, බුදු සසුනේ අවසාන ශ්‍රාවකයා ලෙසින් ජීවමාන බුදුරදුන් අභිමුව පැවිදි උපසම්පදාව ද ලැබුවේ ය.

ඉතිරිය 10 පිටුවට ....



ශාස්ත්‍රපති
**රත්ගම සුනීත හිමි**



# උපෝසථ සීලයේ අනුසස් අපමණයි

**අපගේ ශාස්තෘන් වහන්සේ අමා මහ නිවන සාක්ෂාත් කිරීම පිණිස ගමන් කළ යුතු මාර්ගය ලෙස වදාළේ ආර්ය අෂ්ටාංගික මාර්ගය යි. මෙය සීල, සමාධි, ප්‍රඥා යන ත්‍රි ශික්ෂාවෙන් යුතු වේ. තෙරුවන් සරණ ගිය ශ්‍රාවකයා මුලින් ම හික්මෙන්නේ සීලය තුළ යි. නිති පන්සිල් සුරකින ඔහු පොහොය දිනට අංග අටකින් යුතු උපෝසථ සීලය සමාදන් වෙනවා.**

## නුවණින් විමසීම

උපෝසථ සීලයේ අනුසස් පිළිබඳ අංගුත්තර නිකායේ සඳහන් "විශාඛා උපෝසථ සූත්‍රයේ" දී භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළා. පින්වත් විශාඛා අංග අටකින් යුතු උපෝසථ සීලය සමාදන්වීම මහත්ඵල ඇත්තේ වෙයි. මහත් අනුසස් ඇත්තේ වෙයි. මහත් බැබළීම් ඇත්තේ වෙයි. මහත් යහපත ඇත්තේ වෙයි."

විශාඛාවෙනි, ආර්ය ශ්‍රාවකයා මෙසේ නුවණින් විමසනවා.

"රහතන් වහන්සේ දිවි ඇති තෙක් සතුන් මැරීම අත්හැර, සතුන් මැරීමෙන් වැළකුණු සේක. දඬු මුගුරු අත්හැර අවි ආයුධ අත්හැර, ලජ්ජා ඇතිව, දයාවෙන් යුතුව සියලු ප්‍රාණ භූතයින් කෙරෙහි හිතානුකම්පිත ව වසන සේක. මමත් අද දින සතුන් මැරීම අත්හැර, දඬු මුගුරු අත්හැර, අවි ආයුධ අත්හැර, ලජ්ජා ඇතිව, දයාවෙන් යුතුව සියලු ප්‍රාණයන් කෙරෙහි හිතානුකම්පාවෙන් වාසය කරමි. මම මේ අංග සමාදන් වී රහතන් වහන්සේ අනුව යමි" කියා මේ පළමු අංගයන්ගෙන් සමන්විත වෙයි.

ආර්ය ශ්‍රාවකයා, උතුම් රහතන් වහන්සේ දිවි ඇති තෙක් ප්‍රාණඝාතයෙන් වැළකී සිටි අයුරු සිහිපත් කරනවා. සොරකමින් වැළකී, බ්‍රහ්මචාරිව වාසය කරමින්, බොරු කීමෙන් වැළකී, මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතයෙන් වැළකී සිටි අයුරු සිහි කරනවා. ඒ වගේම රාත්‍රි භෝජනයෙන් තොර ව විකාලයේ ආහාර ගැනීමෙන් වැළකී සිටි අයුරු, නැටුම්, ගැයුම්, වැයුම්, විකාර දේ නැරඹීම, මල් සුවඳ විලවුන් දැරීම, විසිතුරු වටිනා සුඛෝපභෝගි ආසනවලින් වැළකී සැතපුණු අයුරු සිහිකරමින් පොහෝය දින අෂ්ටාංග උපෝසථ සීලය රකිනවා.

## රජ සැපතට - වැඩි සැපතක්

විශාඛාවෙනි, මේ අංග අටකින් යුතු උපෝසථ සීලය කොපමණ මහත්ඵල වෙයි ද? කොපමණ මහානිශංස වෙයි ද? කොපමණ මහා බැබළීම් ඇත්තේ වෙයි ද? කොපමණ මහා පැතිරීම් ඇත්තේ වෙයි ද?

විශාඛාවෙනි, යමෙක් මේ අංග, මගධ, කාසි, කෝසල, වජ්ජි, මල්ල, චේතිය, වංග, කුරු, පංචාල, මච්ඡ, සූරසේන, අස්සක, අවන්ති, ගන්ධාර, කාම්බෝජ යන සොළොස් මහා ජනපදයන්හි බොහෝ සත්රුවන් ඇතිව ඉසුරුමත් බව, අධිපති බව ඇතිව රාජ්‍ය කරවන්නේ වෙයි ද, මෙය අෂ්ටාංග උපෝසථය සමාදන් වීමෙන් ලැබෙන විපාකයෙහි දහසයෙන් එක් පංගුවක්වත් නොවටියි. ඒ මක් නිසා ද යත් මිනිස් ලොව රජ සැප දිව්‍ය සැප හා සසඳා බලද්දී ඉතා දිළිඳු නිසාවෙනි. දිව්‍ය සැපය ගැන මෙසේ දැනගන්න.

## චාතුම්මහාරාජිකය

විශාඛාවෙනි, මිනිස් ආයුෂයෙන් පනස් වසරක්, චාතුම්මහාරාජික දෙවියන්ගේ එක් රාත්‍රියකි. දවාලකි. එයින් තිස් රැයක් මාසයකි. ඒ මාසයෙන් දොළොස් මසක් අවුරුද්දකි. ඒ අවුරුද්දෙන් දිව්‍ය වර්ෂ පන්සියයක් චාතුම්මහාරාජික දෙවියන්ගේ ආයුෂ වෙයි. මේ ලෝකයෙහි ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ අෂ්ටාංග උපෝසථ සිල් ආරක්ෂා කොට කය බිඳී මරණින් මතු චාතුම්මහාරාජික දෙව්ලොවෙහි උපදින්නේ ය යන කරුණ සිදුවන දෙයකි. දකින්නට ලැබෙන දෙයකි. දිව්‍ය සැප හා සසඳා බලද්දී මිනිස් ලොව රජ සැප ඉතා දිළිඳු ය.

## තව්තිසාව

විශාඛාවනි, මිනිස් ආයුෂයෙන් වසර සියයක් තව්තිසා දෙවියන්ගේ එක් රාත්‍රී දවාලකි. එයින් තිස් රැයක් මාසයකි. ඒ මාසයෙන් දොළොස් මසක් අවුරුද්දකි. ඒ අවුරුද්දෙන් දිව්‍ය වර්ෂ දහසක් තව්තිසා දෙවියන්ගේ ආයුෂ වෙයි. මේ ලෝකයෙහි ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් අෂ්ටාංග උපෝසථ සිල් ආරක්ෂා කොට කය බිඳී මරණින් මතු තව්තිසා දෙව්ලොවෙහි උපදින්නේ ය යන කරුණ සිදුවන දෙයකි. දකින්නට ලැබෙන දෙයකි. විශාඛාවෙනි, දිව්‍ය සැප හා සසඳා බලද්දී මිනිස් ලොව රජ සැප ඉතා දිළිඳු ය.

## යාමය

විශාඛාවනි, මිනිස් අයුෂයෙන් දෙසිය වසරක් යාම දෙවියන්ගේ එක් රාත්‍රී දවාලකි. එයින් තිස් රැයක් මාසයකි. ඒ මාසයෙන් දොළොස් මසක් අවුරුද්දකි. ඒ අවුරුද්දෙන් දිව්‍ය වර්ෂ, දෙදහසක් යාම දෙවියන්ගේ ආයුෂ වෙයි.

## තුසිතය

මිනිස් ආයුෂයෙන් හාරසිය වසරක්, තුසිත දෙවියන්ගේ එක් රාත්‍රි දවාලකි. එයින් තිස් රැයක් මාසයකි. ඒ මාසයෙන් දොළොස් මාසයක් අවුරුද්දකි. ඒ අවුරුද්දෙන් දිව්‍ය වර්ෂ හාරදහසක් තුසිත දෙවියන්ගේ ආයුෂ වෙයි.

## නිම්මාණරතිය

විශාඛාවෙනි, මිනිස් ආයුෂයෙන් වසර අටසියයක් නිම්මාණරති දෙවියන්ගේ එක් රාත්‍රි දවාලකි. එයින් තිස් රැයක් මාසයකි. ඒ මාසයෙන් දොළොස් මසක් අවුරුද්දකි. ඒ අවුරුද්දෙන් දිව්‍ය වර්ෂ අටදහසක් නිම්මාණරති දෙවියන්ගේ ආයුෂ වෙයි.

## පරනිම්මිතවසවත්තිය

විශාඛාවෙනි, මිනිස් ආයුෂයෙන් එක්දහස් හයසිය වසරක් පරනිම්මිත වසවත්ති දෙවියන්ගේ එක් රාත්‍රි දවාලකි. එයින් තිස් රැයක් මාසයකි. ඒ මාසයෙන් දොළොස් මසක් අවුරුද්දකි. ඒ අවුරුද්දෙන් දිව්‍ය වර්ෂ දහසය දහසක් පරනිම්මිතවසවත්ති දෙවියන්ගේ ආයුෂ වෙයි. විශාඛාවෙනි, යම් කරුණකින් මේ ලෝකයෙහි ඇතැම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් අෂ්ටාංග උපෝසථ සිල් ආරක්ෂා කොට, කය බිඳී මරණින් මතු පරනිම්මිත වසවත්ති දෙව්ලොවෙහි උපදින්නේ ය යන කරුණ සිදුවන දෙයකි. දකින්නට ලැබෙන දෙයකි. මේ කරුණ පවසන ලද්දේ දිව්‍ය සැප හා සසඳා බලද්දී මිනිස් ලොව රජ සැප ඉතා දිළිඳු නිසා ය.

සඳත්, හිරුත් යන දෙදෙනා සොඳුරු දැකුම් ඇතිව යම්තාක් දිලෙමින් හැසිරෙත් ද, එසේ හැසිරෙන, අඳුර දුරලන ඒ සඳ, හිරු දෙදෙන දිශා බබුළුවමින් අහසෙහි දිලිසෙයි. මේ සඳ හිරු අතර ලෝකයෙහි මුතු, මැණික්, වෛරෝඩි, සොඳුරු ස්වර්ණ කාංචන යනාදී යම් ධනයක් වේ ද, රත්‍රන් ආකරයක් වේ ද, ඒ සියල්ල අෂ්ටාංග උපෝසථ සිල් සුරකින තැනැත්තාට ලැබෙන විපාකයෙන් දහසයෙන් පංගුවක් තරම්වත් නො වටියි.

එහෙයින්, සිල්වත් වූ ස්ත්‍රියක් වෙයි ද, පුරුෂයෙක් වෙයි ද, අංග අටකින් යුක්ත වූ උපෝසථ සිල් මැනවින් ආරක්ෂා කොට සැප උපදවා ගෙන පින් කර ස්වර්ගයට යන්නාහු යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

වරක් වාසෙට්ඨ උපාසකට බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ සේක. "පින්වත් වාසෙට්ඨයෙනි, සියලු ක්ෂත්‍රියයෝ ත්, මේ අෂ්ටාංග උපෝසථය සමාදන් ව රකිත් නම්, එය සියලුම ක්ෂත්‍රියයන් හට ද, බොහෝ කල් හිත සුව පිණිස වන්නේ ය. වාසෙට්ඨයෙනි, සියලුම බ්‍රාහ්මණයෝත්, සියලුම වෛශ්‍යයෝත්, සියලුම ශුද්‍රයන්හට ද බොහෝ කල් හිතසුව පිණිස වන්නේ ය. වාසෙට්ඨයෙනි, දෙවියන් සහිත වූ, මරුන් සහිත වූ, බඹුන් සහිත වූ, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ, දෙව් මිනිස් ප්‍රජාවෙන් යුතු සියලු ලෝකයේ මේ අෂ්ටාංග උපෝසථය සමාදන්ව රකිත් නම්, එය දෙවියන් සහිත වූ, මරුන් සහිත වූ, බඹුන් සහිත වූ, ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ, දෙව් මිනිස් ප්‍රජාවෙන් යුත් සියලු ලෝකයාට බොහෝ කල් හිත සුව පිණිස වන්නේ ය.

එනිසා මේ සා අනුසස් ඇති, බැබළීමක් ඇති අෂ්ටාංග උපෝසථ සීලය සතර පොහොයට ම සමාදන් වන්නටත්, සමාදන් වූ සීලය ආරක්ෂා කර ගන්නටත් ධෛර්ය වන්ත වන්න.

නයනා නිල්මිණී



බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
දුරකථන - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

වෙසක් අව අටවක 2023-05-12

# නිවැරැදි කළ යුතු වරදින්නට පළමුව ය

මහා වෘක්ෂයක ඇරඹුම කුඩා පැළෑටියකිනි. එය අතු ඉති ලා විසල් වෘක්ෂයක් ව වැඩෙන්නේ මහ වැස්සෙන්, කාෂ්ඨක අවු රශ්මියෙන් ආරක්ෂා වී ජලය, පොහොර හා අනෙකුත් සාධක නිසි කලට නිසි ලෙස ලැබීමෙන් ය. මිනිස් දරුවා ද එසේ ය. ඔහු නිරෝගීව වැඩෙන්නේ, යහපත් පුරවැසියෙක් ව සමාජයට පිවිසෙන්නේ කුඩා කල නිසි පෝෂණය, ආදරය, රැකවරණය සේ ම යහපත් මඟ පෙන්වීම නො අඩුව ලැබුණේ නම් ය. ඒ සාධක දුර්වල වන තරමට ඔහු කායිකවත්, මානසිකවත් කඩා වැටේ. ඒ ඇදවැටීම ඔහුගේ මෙලොව ජීවිතයෙන් කෙළවර නොවී පර ලොවටත්, ඔහුගෙන් කෙළවර නොවී ජීවත්වන සමාජයටත් නරක බලපෑම් ඇති කරයි.

මිනිසා ඇතුළු සියලු සත්ත්ව ජීවිත ආරක්ෂා කරන්නට සමස්ත පරිසරය ම රැක ගන්නට ගසක මෙහෙවර අනල්ප ය. එවන් වෘක්ෂයක් සේ මේ මිනිස් සමාජයට අර්ථදායීව කටයුතු සලසන්නට, මිනිස් සාමාජිකයකුට ද කළ හැකි මෙහෙවර වෙසෙස් ය. එසේ අර්ථාන්විත ජීවිතයක් ගෙවීමට නම් ළමා වියට අදාළ සෑම සාධකයකින් ම තෘප්තිමත් විය යුතු ම ය. එහි වගකීම්කරුවන් අතර ප්‍රධානත්වය මව්පියන්ට ය. භාරකරුවන්ට ය.

මහින්දාගමනයත් සමඟ සම්බුදු දහමින් සුපෝෂිත ලාංකේය බොදු සමාජයේ පෙරදා ළමයාට සුවිශේෂත්වයක් ලැබුණි. ඒ කුඩා දරුවාගේ කය සේ ම මනස ද පෝෂණය කිරීමටයි. මනස පෝෂණය කිරීමේ දී අධ්‍යාපනයට සේ ම ආධ්‍යාත්මික ගුණධර්ම වර්ධනය කිරීමෙහි ලා ප්‍රමුඛත්වය ලැබුණි.

අද අප ඇස ගැටෙන, ප්‍රතිඵල අත්විඳින අහස සිඹින මහා දාගැබ්, විහාරාරාම, සයුර පරදන මහා වැව්, ලොවක් විස්මිත කරන අපූර්වතම කලා කෘති ඇතුළු නේක විධ උරුමයන් ඒ සමාජ රටාවේ ප්‍රතිඵලයන් ය.

එකල ස්වර්ණාභරණයෙන් සැරසුණු රුවැති කාන්තාවකට දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා තනි මඟ ගියත් නිරුපද්‍රිත ව ඒ ගමන අවසන් කරන්නට තරම් හැකියාව තිබුණ බව පැවසේ. ඒ හෙළයා සතු වූ හැදියාවේ මහිමයයි. එහෙත් විවෘත ආර්ථිකයත් සමඟ ටිකෙන්ටික අභාවයට ගිය මේ හර පද්ධතීන් විද්‍යාවේ දියුණුවත් සමඟ වේගයෙන් විනාශ වී යන සැටියක් පෙනේ. එදිනෙදා වාර්තාවන විවිධ සිදුවීම් එයට නිදර්ශන ලබා දෙයි. නො ඇසිය යුතු දේ, අදහාගත නොහැකි දේ අසන්නට ලැබේ. මෙවැනි තත්ත්වයක අපේ සමස්ත සමාජයට යන පණිවුඩය යහපත් නොවන්නේ වැරැදි දේ සාමාන්‍යකරණය වීමට ත් ඉඩ ඇති නිසා ය.

අනෙක් අතට කුඩා දරුවාගේ සිට වයෝවෘද්ධයා දක්වා ම හිංසාවෙන්, පීඩාවෙන් තොරව නිදහසේ ජීවත්වීමට ඇති අයිතිය කවරෙක් විසින් හෝ උදුරා ගත්තේ නම් ඔවුන්ට දැඩි ලෙස නීතිය ක්‍රියාත්මක විය යුතු ය. අශ්වයා ගියාට පසු ඉස්තාලය වසා පලක් නොවන්නා සේ මෙහිදී ප්‍රධාන තැනක් දිය යුතු වරදින්නට පෙර වළකා ගැනීමටය. එය කළ යුතු මිනිස් දරුවා බිහ තෝරන වයසේ සිට ය. මවුපියන්ට කීකරු, ගුණ ධර්ම සුපෝෂිත, සරලව කියනවා නම් මිනිස් ජීවිතයේ වටිනාකම හඳුනන පරපුරක් නිර්මාණය කිරීමෙහි ලා ප්‍රායෝගික තීන්දු තීරණ වහා ගත යුතුව තිබේ. නිවෙසේ පටන් පාසල, පන්සල ප්‍රධාන කොට අදාළ සෑම ආයතනයක ම වගවීම ඊට අත්‍යවශ්‍ය වේ.

---

# කළ පින් ගෙවී අවසන් වනවා නැවත නැවත පින් රැස් කරන්න



**පින යනු යහපත් චේතනාවයි. දන, ශීල ආදී යහපත් ක්‍රියාවන් කිරීමෙන් සිතේ ඇතිවන්නා වූ ලෝභ, ද්වේශ, මෝහ ආදී අකුසලයන්ගෙන් වෙන් වූ යහපත් සිතිවිලියි. ඒ යහපත් චේතනාව නිසා මිනිස් සිත පිවිතුරු වේ. පිරිසුදු වේ.**

අපිරිසුදු සිත, අපිරිසුදු ජලය මෙනි. අපිරිසුදු වූ ජලයෙන් බීමට, නෑමට ආදී වූ ප්‍රයෝජන ගත නොහැකි ය. එසේ ම අපිරිසුදු සිත යහපත් වූ ක්‍රියාවක යෙදිය නොහැකි ය. කැළඹුණු ජලයෙහි වූ අපවිත්‍ර දෑ ජලයේ යටට බැස ගත් විට හෝ සම්පූර්ණයෙන් ම ඉවත් වූ කල ජලයෙන් ප්‍රයෝජන ගත හැකි ය. එමෙන්ම මිනිස් සිතක ඇතිවන්නා වූ ලෝභාදි දූවිලි තදංග විෂ්කම්භන ප්‍රහාණයන්ගෙන් වශයෙන් යටපත් වූ විට හෝ සමුච්ඡේද ප්‍රහාණයෙන් සම්පූර්ණයෙන් ම ඉවත් වූ විටක යහපත් ක්‍රියාවන්හි යෙදිය හැකි ය.

එසේ හෙයින් දානාදි පුණ්‍ය චේතනා අපිරිසුදු වී පවත්නා වූ සිතෙහි හට ගන්නා ලෝභාදි දූවිලි සෝදා හැර පවිත්‍ර කරන ධර්මයක් යැයි වටහා ගත යුතු ය.

පෙර අත්භවයක තමන් විසින් රැස් කරන ලද දානාදී පුණ්‍ය චේතනාවන් යම් අයෙක් තුළ ඇත්තේ ද එය පෙර කරන ලද පින් ඇති බව යැයි පැවසේ.

පින යනු මිනිස් සිත පිරිසුදු කරන ධර්මයකි. පිරිසුදු වූ සිතින් පවසන වචන පවිත්‍ර වූ සිතින් කරන ක්‍රියා නම් වූ මේ සියල්ලම මිනිසාගේ යහපත පිණිස ම දියුණුව පිණිසම පවතින්නේ ය.

"ඉධ නන්දති පෙච්ච නන්දති
කත පුඤ්ඤො උභයත්ථ නන්දති
පුඤ්ඤං මෙ කතන්ති නන්දති
භීයො නන්දති සුග්ගතිං ගතො"

පින් කළ තැනැත්තා' මෙලොව ද සතුටු වෙයි. පරලොව ද සතුටු වෙයි. දෙලොව ම සතුටු වෙයි. කිසි කලෙකත් පසුතැවීමට සිදු නොවේ. තමන් බොහෝ පින් කරන ලදැයි සිතමින් සතුටු වෙයි. සිහි මුළාව මරණයට පත් නොවේ. මරණින් මතු ද නිදා සිටි අයකු නින්දෙන් පිබිදෙන්නාක් මෙන් සුගතිගාමීව සුව විඳිමින් වඩ වඩාත් සතුටට පත්වේ.

පින නම් දෙව් මිනිස් සියලු සම්පත් දෙන්නා වූ උතුම් නිධානයකි. යම් දෙයක් යමෙක් පතන්නේ ද? ඒ සියල්ල පුණ්‍ය නිධානයක් සේ ලැබෙන්නේ ය.

මේ බුද්ධ ශාසනයෙහි ලාභීන්ගෙන් අග්‍රස්ථාන ලැබූ සීවලී මහරහතන් වහන්සේ යම් තැනක විසුවේ ද? වුවමනා ප්‍රමාණයටත් වඩා සිව්පසය ලැබූහ. ඒ වගේ ම "ලෝසක" තෙරුන් වහන්සේට කිසිම දිනෙක වුවමනා ප්‍රමාණයටවත් සිව්පසය නො ලැබිණි. උන්වහන්සේ පිරිනිවන්පාන දිනයෙහිදීවත් ප්‍රමාණවත් සේ දානය නො ලැබී තිබිණි. ඒ වගේ ම සෝසක සිටුතුමා ළදරු වයසේ දී සත් වරක්ම මරණයට පත් කරන්නට උත්සාහ කළහ. නමුත් පෙර කරන ලද පින නිසා ඒ හැම අවස්ථාවක දී ම නිදහස්ව සුවසේ වැඩී මහත්වූ සිටු සම්පත් පවා ලබන්නට හැකි විය.

මේ ආදී ලෙසින් පෙර බොහෝ පින් කළ, නො කළ උතුමන් ගැන සලකා බලන විට, දෙවියකු වුවත්, මනුෂ්‍යයකු වුවත්, ගිහි වුවත්, පැවිදි වුවත්, රහත් වුවත් වෙනසක් දක්නට ලැබෙන බව සත්‍යයකි. මේ නිසා මේ මනුෂ්‍ය ලෝකයේ වෙසෙන සියලු දෙනාට ම එකසේ ම පින උපකාර වන බව තේරුම් ගත යුතු ය.

පෙර පින් නැත්තා සැප සම්පත් ලැබීමට කොතෙක් වීර්යය කළත් එයින් යැපීමට පමණක් ධනය ලබයි. මහත් වූ ධනයක් නො ලබයි. පින් නො මැත්තාගේ සම්පූර්ණ ව්‍යායාමය මහත්වූ අනර්ථය පිණිස ද දුක පිණිස ද පවතී. පින් කළ තැනැත්තාගේ පරිභෝජනයට සුදුසු වූ වස්තුවක් හදිසියේ හෝ පින් නොකළ තැනැත්තකුගේ අත පත් වූයේ ද එය ඔහු සමීපයෙහි දීර්ඝ කාලයක් නො පවතී.

ඒ වගේ ම පින් නැත්තන් විසින් උපදවන්නා වූ බොහෝ යහපත් දේ ඔවුන්ගේ පරිභෝජනයට නො පැමිණ පින් ඇත්තවුන්ගේ පරිභෝජනයට ලැබෙයි. ඒ බව නුවණින් යුතුව ලෝකය දෙස බලන්නකුට පහසුවෙන් ම අවබෝධ කර ගත හැකි ය. උදාහරණයක් ලෙස මෙසේ සිතන්න. මිනිසුන් කණ්ඩායමක් විසින් අව්වේ වේලෙමින්, වැස්සේ තෙමෙමින් ගතේ වාරු නැති වෙන තරම් බර ඔසවමින් මාස ගණනක් හෝ අවුරුදු ගණනක් වෙහෙසී තැනූ අලංකාර වූ නිවසක අනිකෙක් සුව සේ වාසය කරයි. ගොඩනැගූ අයට පසු කාලයක දී එම නිවසට ඇතුල්වීමට පවා ඉඩක් නො ලැබේ.

ඒ වගේම යමෙක් බොහෝ වෙහෙසී සැදූ අලංකාර වූ සුව පහසු ඇඳ, පුටුවල අනිකෙක් සුව පහසුවෙන් නිදයි. හිඳ ගනියි. ඇඳ පුටු තැනූ පුද්ගලයා සමහර විටක වඩු මඩුවේ ලෑලි මැස්ස මත දුක සේ නිදාගෙන සිටියි.

මෙසේ පෙර කරන ලද පින් ඇති තැනැත්තා බොහෝ භවභෝග සම්පත් ලබා යම් කලක දී බුදුරජාණන් වහන්සේ කෙනකුගෙන් හෝ බුද්ධ ශ්‍රාවකයකුගේ ධර්ම දේශනාවක් ඇසීමෙන් සෝවාන් ආදී මාර්ග ඵලයන්ට ද පැමිණීමෙන් උතුම් වූ ලෝකෝත්තර වූ නිර්වාණ සම්පත්තිය ද ලබන්නේ යැයි කියැවේ.

එලෙස ම පින් මද පුද්ගලයාට දහසක් බුදුවරුන්ගේ ධර්ම දේශනාවලට සවන් දුන්නත් මාර්ග ඵලාවබෝධයක් නො වන්නේ ය.

මෙලොව වශයෙන් සැප ලැබීමට බොහෝ ලෙසින් උපකාර වනුයේ පෙර කරන ලද පිනම ය. පිනෙ හි ශක්තිය පවත්නා තෙක් නොයෙකුත් සැප සම්පත් ගෙන දෙන්නේ ය. පින විපාක දී ගෙවී ගිය පසු සියලු සම්පත්වලින් පිරිහෙන්නේ ය. ඒ නිසා ගොවියා නැවත නැවත අස්වැන්න ලැබීම පිණිස නැවත නැවත කුඹුරු වපුරන්නාක් මෙන් අප ද නැවත, නැවත පින් කළ යුතු ය.

පෙර පින් බලයෙන් අත්පත් වූ මෙලොව සැප සම්පත් අනුභව කිරීමෙන් පමණක් ම තෘප්තියට නො පැමිණ මෙලොව සැප සම්පත් තව තවත් තහවුරු වනු පිණිසත් මතු මතු ද සැප ලබනු පිණිසත් අප්‍රමාදව පින් රැස් කළ යුතු ය.

දීපා පෙරේරා



# දියුණුවේ දොරටු අරිනවාද ? වසනවාද ? තීරණය කළ යුතු තමන් ම ය

**ගිහියාගේ අවශ්‍යතා බොහෝ වෙති. තම දරුවන්ට උසස් අධ්‍යාපනය ලබා දීම මවුපියන්ගේ පැතුමයි. අද කාලයේ දරුවන්ගේ අධ්‍යාපනය සඳහා බොහෝ වියදම් කිරීමට මවුපියන්ට සිදු වෙයි.**

සිය මව්පිය වැඩිහිටි ඥාති මිත්‍රාදීන්ගේ වුවමනා එපාකම් බලමින් අනෙකාටත් උපකාර කර තම අවශ්‍යතා ඉටුකර ගැනීමට මුදල් හදල්, දේපළ වස්තු අවශ්‍ය වෙයි. එසේ සම්පත් නොමැති වීම ගිහි දිවිය දුකට පත් කරයි. මුදල් හදල් උපයා ගැනීමට, ජීවිකාව ගෙන යාමට ගිහියාට වෙහෙස මහන්සිව ධනය ඉපයීමට සිදු වෙයි.

කුඹුරු කරන ගොවියා ද, ගෙවිලිය ද බොහෝ මහන්සි වී දහඩිය මුගුරු වගුරුවා ලබා ගන්නා අස්වැන්නෙන් තම ගෙදර දොරේ වුවමනාවන් සම්පාදනය කර ගනිති. දුවා දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ද අනෙකුත් දෑ සපයා දීම් ද කරති. මෙලෙසින් ජීවිතය පවත්වා ගෙන යෑමට සැමට ජීවනෝපායන මාර්ගයක් අවශ්‍ය වෙයි. තම තමාගේ ආදායම් මාර්ග, රැකී රක්ෂා කටයුතු ආදිය මනාව ඉටු කිරීමෙන් හරි හම්බ කරන ධනය ජීවිතයේ එදිනෙදා කටයුතු සඳහා ද, අනාගත අවශ්‍යතාවලට ද ව්‍යාපාර කර්මාන්තාදියේ මතු දියුණුවට ද සමාජ යුතුකම් පුණ්‍ය කටයුතු සඳහා ද වැය කිරීමට සිදුවෙයි.

අද බොහෝ දෙනාගේ ආදායමට වඩා වියදම් වැඩි ය. වියදම වැඩි වුවහොත් ඉතිරිකිරීම්, ව්‍යාපාර කර්මාන්තාදියේ මතු දියුණුව සෑදීම කෙලෙස සිදු කළ හැකි වේ ද? අවශ්‍යතා ඉටුකර ගනිමින් ම ඉතිරිකිරීම් කළ යුතු වෙයි.

ඉතිරි කිරීම් යැයි කී විට බොහෝ දෙනාගේ සිතට නැඟෙනුයේ සතෙන් සතේ රුපියලෙන් රුපියල මුදල් ඉතිරි කිරීම ගැන පමණි. මුදල් මෙන්ම කාලය, ජලය, වචන ඉතිරි කිරීමෙන් අත්වන ලාභය සලකා බැලීම වටී. සරල දිවි පැවැත්ම, අල්පේච්ඡතාව පුරුදු පුහුණු කර ගත් විට ජීවිත ගමන පහසු ය. අය වැය සමව පවත්වා ගැනීම සමජීවිකතාවයයි. සමජීවිකතාව දියුණුවට මඟයි. තම දිවි මඟ සරු කර ගැනීමේ දී යහපත් ජීවන මාර්ගයක් තෝරාගත යුතු ය. මස් පිණිස සත්ව වෙළඳාමෙන් ද, මත්පැන්, මත්ද්‍රව්‍ය විකිණීමෙන් ද, වස විස වෙළඳාම, වහල් වෙළඳාම, ආයුධ විකිණීම යන වැරැදි වෙළඳාමෙන් වෙන් වී බුදුරදුන් දේශනා කළ සම්මා ආජීවයෙන් දිවිපෙවෙත සකසා ගැනීමට නුවණැතියා ක්‍රියා කරයි.

ධනය උපයන්නේත්, වස්තුව සම්පාදනය කරන්නේත් සතුටු දිවි පැවැත්මට ය. අවහිර බාධාවලින් තොරව සැපදායක ජීවිතයක් ගත කිරීමට ය. දින, මාස, අවුරුදු ගණන් දුක්විඳ ඉපයූ ධනය, වස්තුව, දේපළ යනාදිය ගිහියා විසින් මනාව ආරක්ෂා කර නොගතහොත් ඔහු මෙන්ම ඔහුගේ පවුලේ සාමාජිකයන් ද දුකට වැටෙයි. හරි හම්බකර ගත් දේ රැක බලා ගැනීමට ගිහියා වග බලා ගත යුතු ය.

පුද්ගලයා තම කායික, මානසික නිරෝගී බව ගැන ද සිතිය යුතු ය. ආර්ථික නිරෝගී බව ගැන ද සිතිය යුතු ය. ආර්ථිකය ලෙඩ වූ විට සතුට, සමඟිය පලා යයි.

බුදුරජාණන් වහන්සේ පුද්ගලයා ද ඔහුගේ වස්තුව ද විනාශයට පත්වන දොරටු හයක් සිඟාල කුල පුත්‍රයාට ඉගැන්වූහ. ඒවායින් වැළකී ක්‍රියා කරන්නාගේ යසස ද වස්තුව ද දින දින දියුණු වනුයේ පස් කැට එකතු කොට වේයකු බඳින තුඹසක් පරිද්දි ය. එනිසා තමාගේ යසස ද, වස්තුව ද විනාශ වන ධන පරිහානි අවස්ථා හය මැනවින් දැන උගෙන යහපෙතහි හැසිරී තමාගේ මෙලොව දියුණුව ද පරලොව සුගතියට ද වැඩ සාදා ගනිමු.

ධනය වැනසෙන ධන විනාශ මුඛ හය කෙරෙහි අපේ අවධානය යොමු කරමු.

කතමානී ඡ භොගානං අපායමුඛානි න සෙවති?
සුරාමේරයමජ්ජපමාදට්ඨානාවුයොගො බො ගහපතිපුත්ත භොගානං අපායමුඛං. විකාලවිසිඛා චරියානුයොගො භොගානං අපායමුඛං. සම්මජ්ජාභිචරණං භොගානං අපායමුඛං. ජූතප්පමාදට්ඨානානුයොගො භොගානං අපායමුඛං. පාපමිත්තානුයෝගෝ භොගානං අපායමුඛං. ආලස්සානුයෝගෝ භොගානං අපායමුඛං

වස්තු විනාශයට හේතුවන කරුණු හය නම්,

මත් පැන් බීම - සුරාපානය, (සුරාමේරය මජ්ඣපමාදට්ඨානුයොගෙ), නුසුදුසු කාලයේ වීථි සංචාරය කිරීම (විකාලවිසිකාචරියානු යොගෙ), නැටුම් ගැයුම් වැයුම් උත්සව දර්ශන ආදියේ ලොල්වීම, (සම්මජ්ජාභිචරණෙ), දූ කෙළියෙහි යෙදීම. (ජූතපමාදට්ඨානානු යොගෙ), පාප මිතුරන් ඇසුරු කිරීම (පාපමිත්තානු යොගෙ) හා අලසකමයි. (ආලස්සානු යොගෙ)

මත්වීමටත් ප්‍රමාදයටත් හේතුවන රහමෙර පානයෙන් වෙන්වීම බෞද්ධයාගේ නිත්‍ය ශීලය වන පංච ශීලයට ද ඇතුළත් ය. එදා මිහිඳු මහරහතන් වහන්සේ වෙතින් දෙවනපෑතිස් මහ රජතුමා ඇතුළු පිරිස පන්සිල් සමාදන්ව බෞද්ධයෝ වූහ.

එදා පටන් හෙළයින් විසින් මත්වන දැයින්

**මත්පැන් බී ලෙඩ සාදූ ගැනීම රෝග මිලදී ගැනීමකි. අනුවණ බවින් මිදුණු, ඉහමොළ ඇති කිසිවෙක් වසවිෂ ශරීරගත කර ගෙන දුක්පීඩා ඇති කර නොගනී. කෙනෙක් ටික ටික දින දින මත්පැනට පුරුදු වීමෙන් ඒවා නොමැතිව ජීවත්විය නොහැකි තත්ත්වයකට පත්වෙයි**

වෙන්ව පණ මෙන් පන්සිල් සුරකිනු ලැබුවේ වර්තමානයේ ගමක්, ගමක් පාසාම වාගේ මත්පැන් අලෙවි ශාලා විවෘත වීම ධර්මද්වීප නමට කැළලකි. පන්සිල් සුරකින බෞද්ධයා මත්වීමට ප්‍රමාදයට හේතුවන දැයින් සැමදා වෙන් වෙයි. දිනකට රට තුළ අලෙවි වන දුම්වැටි ගණන මත්පැන් බෝතල් ප්‍රමාණය ගැන සිතා බැලීම වටියි.

විශේෂයෙන් ම ඉන් රටේ ජීවනාලිය වන තරුණ පරපුර වැනසෙයි. ජාතියට පිළිලයන් වූ මත් උවදුරින් රටවැසි ජනතාව මුදවා ගැනීමට ඇති එකම පිළියම කුඩා කල පටන් සිරිලක් දරුවා ධර්මයට අනුගත කිරීමයි.

පවුලක් හසුරුවන ගෙදරක මූලිකයා, ඒ නිවසේ පියා මත්පැනට ඇබ්බැහි වූ විට ඉන් පිරිහෙන්නේ ඔහු පමණක් නොවේ. ඔහුගේ පවුලේ ඉගෙනුම ලබන දුවා දරුවන් ද බිරිය ද ඉන් පීඩා විඳිති. තම දුවගේ පුතාගේ, පවුලේ දියුණුවට උපයන ධනය, බේබදුකමට වැය කිරීමෙන් බලා සිටිය දී ම ඔහුගේ ධනය නැතිවෙයි. මත්පැන් බොන්නාගේ ධනය බලා සිටියදීම විනාශ වී යයි. (සන්දිට්ඨිකා ධනජානි)

ලෙඩ රෝගාදී දුක් ඇති වීම ස්වභාවික ය. එවිට ඊට මුහුණ දීමට අපට සිදු වෙයි. ලෙඩ වූ කල කිසිවක් කරකියාගත නොහැකි වෙයි. එදිනෙදා කළ යුතු සියලු දේ එනම්, පවුලේ කාර්යයන්, දුවා දරුවන් ගැන සොයා බැලීම්, ව්‍යාපාර කර්මාන්තාදියේ කටයුතු යන මේ සියල්ල ඇනහිටියි. ලෙඩ සුවපත් කර ගැනීමට ඉපයූ ධනය ද වැය වෙයි. ගෙදර ප්‍රධානියා ලෙඩ වීමෙන් මුළු පවුලම අපහසුවට පත්වෙයි.

මිනිස් කය දුර්වලවීමට ද, රෝගයනට, රෝග කාරක විෂබීජයනට ඔරොත්තු දීමට ගතේ සවිය නැතිවීමට ද මත්පැන් බීම හේතු වෙයි. එවිට මත්පැන් බොන්නා රෝග පීඩාදියනට වහා ගොදුරු වෙයි. (රෝගානං ආයතනං)

මත් පැන් බී ලෙඩ සාදා ගැනීම රෝග මිලදී ගැනීමකි. අනුවණ බවින් මිදුණු, ඉහමොළ ඇති කිසිවෙක් වසවිෂ ශරීරගත කර ගෙන දුක්පීඩා ඇති කර නොගනී. කෙනෙක් ටික ටික දින දින මත්පැනට පුරුදු වීමෙන් ඒවා නොමැතිව ජීවත්විය නොහැකි තත්ත්වයකට පත්වෙයි. මෙසේ මත්පැන් බීමට පුරුදුවීමෙන් ඔහු සමාජය පිළිනොගන්නා, අපකීර්තියට පත් වූවකු වෙයි.

මුලින් මුලින් අම්මාට, තාත්තාට, ගුරුවර, වැඩිහිටියනට හොරෙන් හොරෙන් හැංගි හැංගි කිසිවකුට නොදැනෙන්නට ටික ටික මත්පැන් බීමට යම් තැනැත්තෙක් පෙළඹෙනුයේ ඒවා සමාජය පිළිකෙව් කරන බැවිනි. එහෙත් කෙනෙක් ඊට හුරුවෙත් ම ඔහු කෙරෙන් ලජ්ජාව අතුරුදන් වෙයි. හෙතෙම ලජ්ජාවෙන් තොරව හැසිරෙයි. (කොපීන නිදංසනී)

සිතා මතා ක්‍රියාකිරීමේ හැකියාව මත්පැන් ගන්නාට නැත. සිතීමේ ශක්තිය නැති වූවකු, දරුවන්ට පවුලට මඟ පෙන්වනුයේ කෙසේද? වෙළහෙළදාම් රැකී රක්ෂා කටයුතු මනාකොට ඉටුකිරීමට එවැන්නකුට ඇති හැකියාව ගැන කවර කතා ද? මෙසේ මත්පැන් බීමෙන් තම කටයුතු මනාව ඉටුකර ගැනීමට අත්‍යවශ්‍ය වන ඥානය මොට වෙයි. නුවණ දුර්වල වෙයි. (පඤ්ඤාය දුබ්බලීකරණීත්තේව)

අප නම් මධුවිතින් සප්පායම් වන්නේ සාදයක දී පමණි. අන් අවස්ථාවල එසේ නොබොතියි ඇතැම්හු පුරසාරම් දොඩති. නරක දෙයට විශේෂ අවස්ථා ය, එසේ නොවේ ය කියා දෙයක් නැත. මොන තැනක දී වුව ද මත්වතුර බී ගන්නේ නම්, එය බෞද්ධයා කර ගන්නා වරදකි. ඉන් සිල් බිඳෙයි. බලවත් ම වරද නම් ශාස්තෘන් වහන්සේගේ වචනයට අගෞරව කිරීම ය. උන්වහන්සේගේ ඉගැන්වීම නොපිළිපැදීම ය. බුදුවදනට පිටුපාන්නා පිරිහෙයි. පිළිපදින්නා දියුණු වෙයි. එහෙයින් අපි මියෙන තුරාවට මත්පැනින් දුරු වෙමු. මෙලොව ද, පරලොව ද අභිවෘද්ධිය ම පතමු.

*ඉතිරිය 11 පිටුවට ...*

**ගැටමාන්නේ සීවලී හිමි**

# නොදියුණු බව අභිබවා දියුණුවට යන සුපසන් මාවත...

**සමාජය පරිණාමය වීමේ දී කාලීනව මිනිසා මුහුණ දුන් අභියෝග ජය ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් සමාජය විවිධ අංශයන්ට බෙදී ගියේ ය. මිනිසා විසින් තෝරාගනු ලැබූ වෘත්තීන්හි නාමයෙන් කුල ක්‍රමය බිහි විණ. නො එසේ නම් දේව නිර්මාණයක් නිසා නොවේ.**

ලෝකෝත්පත්ති කථාවක් සේ චතුර්වර්ණයේ ප්‍රභවය විස්තර කරන අග්ගඤ්ඤ සූත්‍රය ලෝකය හටගත් කාලයේ ආභස්සර බඹ ලොවින් චුතව මෙලොව පහළ වූ මිනිසුන්ගේ සිත්හි ක්‍රමයෙන් පව්ටු ගති පැවතුම් ඇති වූ බවත්, එකී විෂමාචාරයන් පාලනය කිරීමට හා ජනතාවගේ දේපළවල ආරක්ෂාවට මහජනයා විසින් පත්කර ගන්නා ලද පුද්ගලයාගෙන් ක්ෂත්‍රිය වංශය බිහි වූ බවත් කියයි. ජනතාව සතුටු කරමින්, දැහැමින් පාලනය කළ බැවින් "රාජා" යන නාමය ද, මහජන සම්මතයෙන් පත් වූ බැවින් "මහාසම්මත" යන නාමය ද, කෙත්වලට අධිපති වූ බැවින් "ක්ෂත්‍රීය " යන නම ද ඔහුට ව්‍යවහාර වූ බව සූත්‍රයේ වැඩි දුරටත් දැක්වේ. මෙකල විසූ මිනිසුන් අතර ඇතැම් පිරිසක් සමාජයේ සිදුවන අපචාරී ක්‍රියාවන් දැක ඉන් මිදෙමු යැයි කතිකා කොට ක්‍රියා කළෝ ය. එතැන් පටන් ඔවුන්ට "බ්‍රාහ්මණ" යන ව්‍යවහාරය ඇති විය.

මේ අතර සමහරු මෙවුන්දම් සේවනය කරමින් ගව රක්ෂණය වෙළඳාම ආදී ප්‍රසිද්ධ කර්මාන්තයන්හි යෙදෙන්නට විය. ඔවුහු වෛශ්‍යයන් වශයෙන් ප්‍රසිද්ධියට පත් වූහ.

මෙකී සමාජයේ ඇතැම් කොටස් රෞද්‍ර වූ ද, සැඩ පරුෂ අධම වූ ද, ගති පැවතුම්වලින් යුක්ත වූ අතර ඔවුන් ශුද්‍රයන් වශයෙන් හඳුන්වන ලදී. මෙසේ



අග්ගඤ්ඤ සූත්‍රය චතුර් වර්ණයේ ප්‍රභවය දේව නිර්මාණයක් වශයෙන් නොව සමාජ පරිනාමයේ ප්‍රතිඵලයක් ලෙස දකී.

මනුෂ්‍ය සංහතිය ආරම්භ වූ දා පටන් ම ඔවුන්ගේ විශේෂ ජාතිමය ලක්ෂණ ඇති බවත්, එකී ලක්ෂණ නොනැසී පවත්නා බවත් කලකට පෙර ඇතැම් විද්‍යාඥයන් විශ්වාස කළ නමුදු නූතන ජීව විද්‍යාඥයෝ මානව සංහතියේ වෙන් වෙන් ව හඳුනාගත හැකි ජාති ප්‍රභේද නැතැයි ප්‍රකාශ කරති.

එහෙත් ක්‍රි.පූ. 6 වන සියවස තරම් ඈත අතීතයේ දී බුදුන් වහන්සේ මානව වර්ගයාගේ ඒකත්වය ජීව විද්‍යාත්මක පදනමකින් විග්‍රහ කර තිබෙනු වාසෙට්ඨ සූත්‍රයෙන් පැහැදිලිව දත හැකි ය. වාසෙට්ඨ හා භාරද්වාජ නමැති තරුණ බ්‍රාහ්මණයන් දෙදෙනා අතර බමුණකු වන්නේ ජාතියෙන් ද? නැතහොත් ක්‍රියාවෙන් ද ? යනුවෙන් ගැටලුවක් උපන්නේ ය. මෙයට පිළිතුරු සෙවීම් වස් බුදුන් වෙත ගිය ඔවුන්ට අනෙක් ජාතීන්ගේ විවිධත්වයත් මානව වර්ගයාගේ ඒකත්වයත් ප්‍රකාශ කළ අයුරු මෙකී සූත්‍රයේ දැක්වේ.

තෘණ හා වෘක්ෂ ලතා අතර, විවිධ ජාති ඇත. ඒ ඒ ජාතියට අයත් සලකුණු ද ඇත. එසේම විවිධ වර්ගයාගේ කුරා කුහුඹුවන්, කෘමීන්, වැනි ප්‍රාණීන් ඇත. ඔවුන්ගේ ද විවිධ ජාති හා ඔවුන්ට අයත් සලකුණු ද ඇත. උරගයින් පක්ෂීන් හා මත්ස්‍යයන් අතර, ද විවිධත්වයක් තිබේ. ඔවුන් වෙන් වෙන් ව හඳුනාගත හැකි සලකුණු ද තිබේ. එහෙත් මිනිසුන් අතර එසේ වෙන් වෙන්ව හඳුනාගත හැකි විවිධ ලක්ෂණ නොපෙනේ.

මිනිසුන්ගේ කෙස්, හිස්, කන්, ඇස්, ඇට, නැහැය, තොල, බැම, ගෙල, දසරුව, උදරය, පිට, උකුල, පපුව, යෝනිය යනාදි අංගයන් සම්බන්ධයෙන් අන්‍ය ජාතීන් අතර මෙන් ජාතියට අයත් සලකුණු නැත. මිනිසකු තවත් මිනිසකුගෙන් හඳුනා ගන්නේ සංඥා නාමයෙන් පමණි. මේ නිසා මානව සංහතිය ම එකම වර්ගයකට අයත් වන අතර, ජාති කුල ගෝත්‍ර වශයෙන් බෙදීම හුදු දෘෂ්ටි මාත්‍රයක් හෝ සම්මතයක් පමණක් වන බව තුලනාත්මකව හා තාර්කිකව බුදුන් වහන්සේ පෙන්වා දුන්හ.

යමෙක් දුනු හරඹයෙන් ජීවිකාව කෙරෙයි ද ඔහු සෙබළෙකු මිස බමුණකු නොවේ. යමෙක් කෘෂිකර්මාන්තයෙන් දිවි ගෙවයි ද ඔහු ගොවියෙකි. බමුණකු නොවේ. යමෙක් නානා ශිල්පයෙන් දිවි ගෙවයි ද ඔහු ශිල්පියෙකි. බමුණකු නොවේ. වෙළඳාමෙන් දිවි ගෙවන්නා වෙළෙන්දෙකි. සොරකමෙන් දිවි ගෙවන්නා සොරෙකි. බමුණකු නොවේ. උපතින් ම හැම මිනිසෙක්ම වෘත්තීය අනුව ඔහු විවිධ නාමයන්ගෙන් හඳුන්වනු ලැබේ.

පුද්ගලයාගේ ජන්මය ඔහුගේ වර්ණය නිර්ණය නො කරයි. බමුණකු හෝ අබ්‍රාහ්මණයකු වන්නේ ක්‍රියාවෙන් බව වාසෙට්ඨ හා භාරද්වාජ තරුණ බමුණන්ට බුදුරජාණන් වහන්සේ පැහැදිලි කර දුන්හ. මෙයින් බ්‍රාහ්මණ ආගම විසින් සමාජය තුළ තහවුරු කොට තිබූ වර්ණ භේදය පදනම් විරහිත එකකැයි සනාථ කරන ලදී.

අස්සලායන සූත්‍රයේ වරක් අස්සලායන මානවකයා විසින් බුදුන් හමුවේ බමුණන්ගේ ශ්‍රේෂ්ඨත්වයත්, පාරිශුද්ධියත් වර්ණනා කරන ලදී.

'බ්‍රාහ්මණයෝ ශ්‍රේෂ්ඨ ය. සෝභා සම්පන්න වූ වර්ණ ඇත්තෝ ය. අනෙක් වර්ණයෝ හීන ය. කෘෂ්ණ වර්ණ ය. අපිරිසුදු ය. බ්‍රාහ්මණයෝ මහා බඹු විසින් නිමවන ලද නිසා ඔහුගේ ඖරස පුත්‍රයෝ ය. යනුවෙනි. මෙහිදී බුදුන් වහන්සේ විශ්ව ගත අනෙක් මිනිසුන්ගේ උපත සිදුවන ආකාරයටම බමුණු ස්ත්‍රීන්ගේ ගැබ් ගැනීම, දරුවන් වැදීම, කිරි පෙවීම ආදිය පෙනි පෙනී තිබිය දී ම බමුණන් මහ බඹුගේ මුඛයෙන් උපන් බව පැවසීම අර්ථ ශූන්‍ය බවත්, එය මහ බඹුට කරන අවමානයක් බවත් පෙන්වා දෙමින් වර්ණයන්ගේ ශ්‍රේෂ්ඨත්වය ජන්මීය සාධක මත පදනම් නොවන බව පෙන්වා දුන්හ.

බමුණන් අතිමානයෙන් සැලකූ කුල පාරිශුද්ධිය ද මිත්‍යා විශ්වාසයක් බව දීඝ නිකායේ අම්බට්ඨ සූත්‍රය පැහැදිලි කරයි.

බ්‍රාහ්මණයකුගේ මවුපිය දෙපාර්ශවයෙන් ඔවුන්ගේ පරපුර සොයා ගිය විට එම පරපුරේ මුතුන් මිත්තන් ශාක්‍යයන්ගේ දාසියකගෙන් උපන් බව ප්‍රකට වේ. එසේ නම් ශූද්‍ර වර්ණයට අයත් නැනැත්තියක් බමුණකුගේ මව වී නම් ඇගේ පුත්‍රයා බමුණකු වන්නේ කෙසේ දැයි ප්‍රශ්න කොට බමුණන්ගේ කුල පාරිශුද්ධිය මිත්‍යාවක් බව හෙළි කොට තිබේ.

වර්ණ භේදයක් හෝ ජාති භේදයක් මිනිසුන් අතර නොපැවතිය හැකි යැයි ආර්ථික හා සමාජ විද්‍යාත්මක පදනමකින් යුතුව බුදු දහම කරුණු ගෙනහැර දක්වා තිබෙන අයුරු මජ්ඣිම නිකාගේ මධුර සූත්‍රයෙන් පැහැදිලි වේ.

මහා කච්චායන තෙරුන් හා අවන්ති රජු අතර පැවති සාකච්ඡා චතුර් වර්ණය පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම් ව්‍යවහාර මාත්‍රයක් බවත්, පොදුවේ මිනිසුන් සමාන බවත් මනු නීතියෙන් ශුද්‍රයාට විශේෂ රැකියාවක් පනවා තිබුණු නමුදු සමාජමය වශයෙන් ප්‍රමාණවත් ධන ධාන්‍ය රැස්කොට ගෙන ධනවත් වූ විටෙක අනිකුත් තුන් කුලයෙහි ම පිරිස තම යටතට ගත හැකි යැයි මෙහි දී පෙන්වා දි තිබේ. මජ්ඣිම නිකායේ අස්සලායත සූත්‍රයේ දී ඇතැම් ප්‍රදේශවල ඇත්තේ පාලක පාලිත දෙපක්ෂයෙක් මිස චතුර්වර්ණයක් නොවේ යැයි ද වරින් වර ඔවුනොවුන් පරදවා රටේ පාලන බලතළ අල්ලා ගැනීමෙන් ආර්යයන් දාසයන් බවටත්, දාසයන් ආර්යයන් බවටත් පත්වන බව තහවුරු කිරීමෙන් ද කුල භේදය පිළිබඳ බ්‍රාහ්මණ මතය නිෂ්ප්‍රභා කොට තිබේ.

ලෝභය, ද්වේෂය, මෝහය, මානය, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය වැනි මනෝභාවයන්ගේ ක්‍රියාකාරිත්වය කුල භේදයකින් තොරව සියලු පුහුදුන් මිනිසුන්ට සාධරණ බව බුදුසමය පෙන්වා දෙයි. සියලු මිනිස් ක්‍රියාකාරකම් මනෝමූලිකව සතර අගතියට අවනතව සිදුකරනු ලැබේ. මිනිස් ක්‍රියාකාරකම් මානසික ක්‍රියාකාරිත්වය මත පදනම් වේ නම් මානව වර්ගයාගේ නානත්වයන් පැනවිය නොහැකි ය. එබැවින් වර්ණ භේද වාදයට මනෝවිද්‍යාත්මක පදනමක් ද නැත.

බ්‍රාහ්මණයන් විසින් විමුක්තිය ලැබීම ද එක්තරා කොටසකට පමණක් ඇති අයිතියක් හා හැකියාවක් වශයෙන් සලකන ලදී. එහෙත් බුදු සමය එවැනි සීමාවක් නො පනවයි. බ්‍රාහ්මණයා ගඟට ගොස් නා ශරීරයේ කුණු ඉවත් කරන්නාක් මෙන් අන් අය ද එම ක්‍රියාවේ සමත් වෙතැයි ද, වර්ණ හතරට ම අයත් ඕනෑම කෙනකුට නිවන් අවබෝධ කළ හැකි යැයි බුදුන් වහන්සේ ප්‍රකාශ කළහ.

මේ නිසාම ආචීර්ණ කල්පිත බ්‍රාහ්මණ චින්තනයට අභියෝග කිරීම සම්බන්ධයෙන් බුදුන් වහන්සේට 'ශ්‍රමණ භවත් ගෞතමයන් චතුර් වර්ණයට ම ශුද්ධිය පනවයි' යන චෝදනාව ද එල්ල විය. උන්වහන්සේ න්‍යායිකවත්, ප්‍රායෝගිකවත් විමුක්තිය සම්බන්ධයෙන් කුලය ජාතිය වැනි සාධක බල නො පාන බව ප්‍රකට කළහ. ආධ්‍යාත්මික වශයෙන් නිසි තත්ත්වයට පත් ඕනෑම කෙනකුට විමුක්තිය ලැබීමට බාධාවක් නැත. අවශ්‍ය වන්නේ වීර්ය පමණි. එම වීර්යයෙන් ලත් ආධ්‍යාත්මික සුවයෙහි වෙනසක් නැත. කොසොල් රජු වරෙක බුදුරදුන්ගේ ඇසූ පැනයකට දෙන ලද පිළිතුරින් මේ පිළිබඳ බෞද්ධ ස්ථාවරය තවදුරටත් තහවුරු වේ.

භාග්‍යවතුන් වහන්ස ක්ෂත්‍රීය බ්‍රාහ්මණ වෛශ්‍ය ශුද්‍ර යන මේ වර්ණ සතරක් ඇත. ඔවුන් නිර්වාණය උදෙසා පස් වැදෑරුම් අංගවලින් යුක්ත යැයි සිතමු. නිර්වාණාධිගමය විසින් ඔවුන් අතර වෙනසක් ඇත්ද? මහරජතුමනි, විමුක්ති සම්බන්ධයෙන් ඔවුන් අතර වෙනසක් නොමැත. උදාහරණයක් කියමි. මහරජ එකෙක් වියළි පරඬලායෙන් ගිනි දල්වයි. එකෙක් වියළි සල් දරින් ගිනි දල්වයි. තවකෙක් වියළි අඹ දරින් ගිනි දල්වයි. මහරජ මේ නොයෙක් දරින් කරන ලද ගිනිවල දැල්ලෙහි හෝ පැහැයෙහි හෝ දීප්තියෙහි වෙනසක් නොවන්නේ ද? එසේම මහරජ ව්‍යායාමයෙන් හා පධානයෙන් දල්වන ලද අභ්‍යන්තර ආලෝකය ද එසේ ම ය. මෝක්ෂය අතින් එකිනෙකා අතර ප්‍රභේදයක් නොවෙයි.

ඉතිරිය 11 පිටුවට ...



පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ
රාජකීය පණ්ඩිත
**පයාගල සුමනසාර හිමි**

# යහපත් ඇසුර යහපත ම ගෙනදෙයි

**රහතන් වහන්සේ වැඩියෙන්ම වැඩ සිටි යුගයක් තමයි අනුරාධපුර යුගය කියන්නේ. මේ කාලයේ ශ්‍රී ලංකාවේ ගොඩාක් ප්‍රසිද්ධියට පත් වූ ජනපදයක් තිබුණා. සුරට්ඨ ජනපදය කියලා.**



දඹාන මාවරගල ආරණ්‍ය සේනාසනවාසී ආචාර්ය

**පදියතලාවේ අමරවංශ හිමි**

ජීවන තත්ත්වය අතින් ගොඩක් හොඳ වගේම ගුණ ධර්මවලින් පොහොසත් ජනතාවක් සිටීම මෙයට හේතුවක් වුණා. මේ ජනපදයේ තිබුණා උපසිංහ විහාරය නමින් විහාරයක්. එහි වැඩ සිටි භික්ෂූන් වහන්සේලාගේ ධර්මෝපදේශත් මෙයට බලපෑවා.

දවසක් එක් සොරකුට හිතුණා මේ විහාරය බලන්න යන්න. ඔහු සංඝයා වහන්සේ අඩු අවස්ථාවක් බලලා විහාරයට ගොඩ වුණා. බුද්ධ මන්දිරයටත්, දාගැබ් මළුවටත්, බෝධීන් වහන්සේ සමීපයටත් ගිහින් සැදැහැති බෞද්ධයකු වගේ නමස්කාර කළා. දෙවැනියට කළේ ආරාමයේ අවට සෝදිසි කරලා බලන එක. ඔහුට දකින්න ලැබුණා විශාල දාන ශාලාවක්. භික්ෂූන් වහන්සේ අඩුවෙනකම් ඉඳලා හෙමින් හෙමින් දාන ශාලාවට ඇතුළු වුණා. විශාල ලෝහ භාජනයක් ශාලාව මැද, ඒක බලන බලන අතින් බබළනවා. මෝස්තර කැටයම්වලින් යුක්ත යි. මේකේ වටිනාකම කියා නිම කරන්න බෑ. කොහොම හරි මේ භාජනය අරගෙන යන්න තියනවා නම් හොඳයි. ඒත් ගිහියකු විදියට නම් කවදාවත් මේක අරගෙන යන්න නම් ලැබෙන්නේ නෑ. කරන්න තියන හොඳම දේ තමා මේ විහාරයේ මහණවෙලා මේක අරගෙන යාමයි. එසේ කල්පනා කර ප්‍රධාන තේරුන් වහන්සේ හමුවෙලා

'ස්වාමීනි, මම ගිහි ජීවිතය ගැන බොහෝ ම කලකිරීමට පත් වෙලා ඉන්නේ. මා කෙරෙහි අනුකම්පා කර සසරෙන් එතෙරවීම පිණිස මට පැවිද්ද ලබා දෙන්න'යි ඉල්ලා සියා.

තෙරුන් වහන්සේත් තවදුරටත් විස්තර දැනගෙන පැවිදි කළා. හැම වෙලේම මතක් වෙන්නේ, කල්පනා කරන්නේ විශාල ලෝහ භාජනය සොරකම් කර ගන්නා උපක්‍රමයක් ගැනයි. මෙහෙම නිතර නිතර කල්පනා කරන, හුදකලාව ඉන්න මේ භික්ෂුව ගැන හොයා බලන්න උපාධ්‍යායන් වහන්සේ කල්පනා කළා. දවසක් තමන් වහන්සේගේ කුටියට වැඩම කරවාගෙන.

'ඔබ දැන් බුද්ධ ශ්‍රාවකයෙක්. සම්බුදු සසුනට ඇතුළත් වුණාහම වීර්යවන්තව භාවනා කරන්න ඕන. ධර්මය අධ්‍යයනය කරන්න ඕන. මම කියන විදිහට වැඩ කරන්න'යි ඉතා කාරුණික වදන්වලින් ආමන්ත්‍රණය කරලා උපදෙස් දුන්නා.

ඔහු ඒ කිසිවක් ගණන් ගත්තේ නෑ. එතැනදීත් කළේ තමන්ගේ අදහස ඉටු කර ගන්න ක්‍රමයක් හිතන එකයි. තවත් දවසක් මේ විදිහට ම කතා කරලා ධර්මාවවාද වගේම භාවනා කමටහන් දුන්නා. එදාත් ඒවා ගණනකට ගත්තේ නෑ. මෙහෙම මාස ගණනක් උත්සාහ කළා. ලෝහ භාජනය සොරකම් කරගෙන පිටවෙන්න. ඒත් පුළුවන්කම ලැබුණේ නෑ.

උත්සාහය අත්නොහැරම අවුරුද්දක් ගත කළා. එහෙත් පුළුවන්කමක් ලැබුණේ ම නෑ. මේ කාලය පුරාවට ම උපාධ්‍යායන් වහන්සේ ඔහුට කරුණාවෙන් ධර්මය කියා දුන්නා. භාවනාව පුරුදු කළා.

තවත් දවස් කිහිපයක් ගත වෙන කොට හැමෝම පුදුම කරමින් හැමදාම උදේටත්, දවාලටත්, සවසටත් මේ ලෝහ පාත්‍රය ළඟ විශාල මල් වට්ටියක් තබා එයට වන්දනා කරන්න පටන් ගත්තා. මේ පුරුද්ද සතියක්, දෙකක්,තුනක් වශයෙන් මාස ගණන් ගත වුණා. උපාධ්‍යායන් වහන්සේ එයට හේතු විමසුවා. එහෙත් උත්තරයක් දුන්නේ නෑ. මෙහෙම හැමදාම පාහේ එක් අයෙක් හෝ මේ කාරණයට හේතු විමසුවත් කවදාවත් ඒකට උත්තර දුන්නේ නෑ. දායකයිනුත්, අවට විහාරවල භික්ෂූන් වහන්සේත්, මේ ගැන විමසන්න පටන් ගත්තා.

වැඩිහිටි භික්ෂූන් වහන්සේ උපදෙස් දුන්නා. 'ඇවැත්නි, ඔබ මේ කරන ක්‍රියාව වැරැදියි. බුදුන් වහන්සේ වැඩ සිටින විහාරයට හෝ දාගැබ් මළුවට ගිහින් හෝ බෝධීන් වහන්සේ වෙත ගිහින් මේ මල් පූජා කරන්න. මේ ලෝහ පාත්‍රයට මේ වගේ දෙයක් කරන්න එපා. එය බුදුන් වහන්සේ අනුදැන වදාළ දෙයක් නොවෙයි'යි කියමින් අවවාද අනුශාසනා කළා.

> **කොතරම් නපුරු, පව්ටු හෝ අසත්පුරුෂ කෙනෙක් වුවත් හොඳ මිනිසුන්ගේ සහ ධර්මයේ ඇසුර ලබනවා නම් මෙලොවත්, පරලොවත් ආලෝකවත් කර ගන්නවා. හැම මොහොතකම තවත් කෙනෙක් යහපත් මාර්ගයට ගැනීමට උත්සාහ කිරීම බෞද්ධයන්ගේ යුතුකමක් මෙන්ම වගකීමක් ද වෙනවා**



නමුත් මේ භික්ෂුව අපවත්වෙන්න ඇඳට වැටිලා ඇවිද ගන්න බැරි වෙනකම්ම මේ කටයුත්ත නො නවත්වා නො කඩ කොට කරගෙන ගියා.

දිනක් තමන් වහන්සේගේ ආයු කාලය අවසන් බව හොඳින් ම දැනගෙන විහාරයේ අනෙක් භික්ෂූන් වහන්සේලාටත්, දායකයින්ටත්, හිතවතුන් සියලු දෙනාටත් ඇසෙන සේ 'බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නයේත්, ආර්ය මාර්ග ප්‍රතිපදාවේත් යම් සැකයක් යමෙකුට තියනව නම් මගෙන් විමසා දැනගන්න. ඒ හැම කරුණක් ම හොඳින් පැහැදිලි කර දෙනවා'යි සිංහනාදයක් කළා.

මේක අහපු විහාරවාසී තෙරුන් වහන්සේලාත්, දායකයිනුත්, හිතවතුනුත් ඉක්මනින්ම එකතු වුණා. තෙරුන් වහන්සේගෙන් ප්‍රශ්න අහන්න. හැමෝටම ඕනකම තිබුණේ එකම ප්‍රශ්නයකට උත්තරයක් දැනගන්න. ඉතින් තෙරුන් වහන්සේ සමීපයට පැමිණි හැමෝම

'ස්වාමීනි, බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය ගැනත්, ආර්ය ප්‍රතිපදාව ගැනත් දැන ගන්න පුළුවන්. එහෙත් ඔබ වහන්සේ පිරිනිවන් පෑවායින් පසුව අහල දැනගන්න කෙනෙක් නැති ප්‍රශ්නයක් තියනවා'යි කියා සිටියා.

තෙරුන් වහන්සේ කියා සිටියා එහෙම ප්‍රශ්නයක් තිබෙනවා නම් මම එයට පිළිතුරු දිය යුතුම වෙනවා. තිබෙන ප්‍රශ්න අහන්න'යි නැවතත් කියා සිටියා. හැමෝම වෙනුවෙන් එක් භික්ෂුවක් තෙරුන් වහන්සේට වන්දනා කරලා

'ස්වාමීනි, වසර ගණනාවක් ම ගෙවිලා ගියා. එහෙත් ඔබ වහන්සේ ඇඳට වැටිලා ඇවිද ගන්න බැරිවෙනකම්ම තුන්වතාවක් දාන ශාලාවේ ලෝහ පාත්‍රයට මල් පූජා කර වන්දනා කරනවා. ඒකට හේතුව අද පහදා දෙන්න'යි ඉල්ලා සිටියා.


පින්වත් ස්වාමීනි, පින්වත් ඇවැත්නි, පින්වත් දායකයිනි, මම අද එයට හේතුව පහදලා දෙන්නම්. මීට වසර ගණනාවකට පෙර මම මේ විහාරයට ආවේ විහාරයේ ප්‍රසිද්ධිය නිසා බලල යන්න හිතාගෙන. එදා විහාරයටත්, දාගැබ් මළුවටත්, බෝධියටත් ගිහින් බොරුවට වන්දනා කළා. මගේ හිතේ තිබුණේ විහාරයේ මොනයම් දෙයක් හෝ හොරකම් කරගෙන යන්න. ඉතින් ඒ අදහසින් ඇවිදින මට දාන ශාලාවේ තිබෙන, කැටයම් මෝස්තරවලින් බබළන, මේ විශාල ලෝහ පාත්‍රය දකින්න ලැබුණා. ගිහියකු විදිහට කවදාවත් මේ පාත්‍රය හොරකම් කරගෙන යන්න බැරි බව දැනගෙන මම පැවිදි වුණා.

ධර්මය හැදෑරීමටවත්, භාවනාවේ යෙදීමටවත් මට කවදාවත් හිතක් පහළ වුණේ නෑ. සොරකම් කරන්නමයි හැම වේලාවක් ම යෙදෙව්වේ.

දවසක් මගේ උපාධ්‍යායන් වහන්සේ මා කුටියට කැඳවලා ධර්මාවවාද කළා. භාවනා කමටහන් දුන්නා. එහෙත් වසර ගණනාවක් ම මම ඒවා හිතින් ස්පර්ශ කිරීමක්වත් කළේ නෑ. මගේ අදහස වුණේම ලෝහ පාත්‍රය හොරකම් කරගෙන යන එක. එහෙත් ක්‍රමයෙන් මම ධර්මයට නැඹුරු වුණා. භාවනා කළා. පාත්‍රයට වඳින්න පටන් ගත්තේ මම සෝවාන්, සකෘදාගාමී, අනාගාමී යන මාර්ගඵල ලබා ගෙන අර්හත් බව ලැබූ දා සිටයි. බොහෝ වසර ගණනකට පෙර මම ආර්ය සංඝ ගණයට අයත් වුණා. මම අද පිරිනිවන් පාන්නේ අරහත් තෙරනමක් විදිහට යි. ඒ ප්‍රීතිය මම දැන් විඳිනවා. මේ ලෝහ පාත්‍රය නිසයි මම සසරෙන් මිදුණේ. ඒ නිසයි මම එයට වන්දනා කළේ'යි කියමින් තෙරුන් වහන්සේ ප්‍රශ්නයට පිළිතුරු දී අවසන් වනවාත් සමඟ පිරිනිවන් පෑවායි" පැරැණි සිංහල කථා පුවතක් සීහළවත්ථු නම් ඉපැරැණි බණ කථා පොතේ සඳහන් වෙනවා.

පාපී සිතිවිල්ල ම අර්හත් භාවය ලබා ගැනීමට උපකාර වුණා. හොඳ ගුරු, ඇසුරත්, යහපත් මිනිසුන්ගේ ඇසුරේ ජීවත් වීමට ලැබීමටත් වැරැදිවලින් මිදී යහපත් වීමට ඉවහල් වන බව මේ කථා පුවත අපට ආදර්ශ සපයනවා.

කොතරම් නපුරු, පව්ටු හෝ අසත්පුරුෂ කෙනෙක් වුවත් හොඳ මිනිසුන්ගේ සහ ධර්මයේ ඇසුර ලබනවා නම් මෙලොවත්, පරලොවත් ආලෝකවත් කර ගන්නා බවත් පෙන්වා දෙනවා. හැම මොහොතකම තවත් කෙනෙක් යහපත් මාර්ගයට ගැනීමට උත්සාහ කිරීම බෞද්ධයන්ගේ යුතුකමක් මෙන්ම වගකීමක් ද වෙනවායි මේ පුවත තවදුරටත් අපට ආදර්ශ සපයා දෙනවා.



# තිරිසන් සතුන් බණ අසා සුගතියේ උපදින්නේ කොහොමද?

**තිරිසන් සතුන් ද බණ අසනවා යැයි කී විට කරුණු නොදන්නා ඇතැම් අය නම් එයට සිනාසෙති. නින්දා කරති. අපහාස කරති. නාමරූප ගැන නොදන්නා මෝඩ අනුවණයන්ට සිනාසෙන්නට විහිළු කරන්නට එය හේතුවකි.**

නමුත් නාමරූප ගැන කරුණු කාරණා දන්නා නුවණැත්තෝ නම් එය එකහෙළා පිළිගනිති. ප්‍රසංසා කරති. ඒ ගැන සතුටු වෙති. ඒ පින් ද අනුමෝදන් වෙති. සතුන්ට අභය දානය ද දෙති. තවත් බොහෝ දේ කරමින් ධර්මයෙහි හැසිරෙති.

මෙම ලිපියෙන් පැහැදිලි කර දෙන්නේ තිරිසන් සතුන් බණ අසා සුගතියේ උපදින්නේ කෙසේද කියා යි. එය අපට දෙයාකාරයකින් පැහැදිලි කර දිය හැකි ය.

එක් ආකාරයකට ත්‍රිපිටකයේ සඳහන් වන තිරිසන් සතුන්ව සිට දිව්‍ය ලෝකයේ උපන් අයගේ චරිත කතා ඇසුරෙන් පෙන්වා දිය හැකි ය. අනෙක් ක්‍රමය වන්නේ එය සිදුවන්නේ කෙසේ දැයි නාමරූප ඇසුරෙන් ම සිදු වන ආකාරය පෙන්වා දීමයි.

පළමුව තිරිසන් සතුන්ව සිට දිව්‍ය ලෝකයේ උපන් අයගේ චරිත කථා කිහිපයක් කෙටියෙන් කියන්නෙමු.

## කන්ථක දිව්‍ය පුත්‍රයා

අතීතයේ විවිධ භවවල දී මහ බෝධි සත්වයන් වහන්සේත් සමඟ දැඩි කල්‍යාණ මිත්‍රත්වයෙන් ආ කන්ථක අශ්වයා මහ බෝසතුන් සමඟ එකම දිනයේ දී උපත ලැබී ය. බෝසතුන් අභිනිෂ්ක්‍රමණය කළ දින වෙන්ව යන්නට සූදානම් වන විට, ඒ වියෝ දුක ඉවසා ගැනීමට නොහැකිව කන්ථකට බරපතළ දරුණු මාරාන්තික ආබාධයක් ඇති විය. ශෝකයෙන් ඇතිවන්නේ අකුසල් සිතකි. එහෙත් සම්‍යක් සම්බෝධිය ලබා ගැනීමට නික්මුණ බව බෝසතුන් ඡන්න ඇමතිට කියනවා අසා නිරාමිස වූ උදාර වූ, ප්‍රීති සොම්නසක් ද ඇති විය. එය කුසල් සිතකි. එයින්ම මරණින් පසු තව්තිසා දෙවු ලොව උපත ලබා, උදාර වූ දිව්‍ය සැප පහළ විය. මරණාසන්න චිත්ත විථිය වූයේ කුසල චිත්ත වීථිය යි.



රත්නපුර, පැල්වාඩිය
මිණිපුර අමා ශාන්ති තපෝවනය
**තපෝවනයේ රතන හිමි**

## මණ්ඩුක දේව පුත්‍රයා

ගග්ගරා පොකුණෙහි වාසය කළ ගෙම්බෙක් ඉවුරට පැමිණ භාග්‍යවතුන් වහන්සේ ධර්ම දේශනා කරන විට එම ධර්මය දෙසන ශබ්දය අසමින් සිටියේ ය.

ගොපලු දරුවෙක් එතැනට පැමිණ තමන්ගේ අතේ තිබුණ කෙවිට බිමට ඇණ එයට බරවී බණ ඇසී ය. ඔහුගේ කෙවිටට මෙම ගෙම්බාගේ හිස හසු වුණි. එයින්ම හිස සිදුරු වී ගෙම්බා මරණයට පත් විය.

භාග්‍යවතුන් වහන්සේගේ උතුම් ශ්‍රී සද්ධර්මය කෙරෙහි සුළු මොහොතක් චිත්ත ප්‍රාසාදයෙන් සිටීමේ හේතුවෙන් ඔහු මිය යාමත් සමඟම ත්‍රිහේතුකව දෙව්ලොව උපත ලැබී ය. එහි උපත ලබා මෙතෙක් සම්පත් ලැබුණේ කෙසේ දැයි බැලී ය. භාග්‍යවතුන් වහන්සේගෙන් ධර්ම ශ්‍රවණය කිරීම නිසා ප්‍රතිඵල ලැබූ බව දැක නැවත පැමිණ භාග්‍යවතුන් වහන්සේගෙන් ධර්ම ශ්‍රවණය කර සෝවාන් විය.

## පාරිලෙය්‍ය වනයේ ඇතා

බුදුරජාණන් වහන්සේ පාරිලෙය්‍ය වනයේ වස් වැස නැවත වඩින විට පාරිලෙය්‍ය ඇතා පා සිවුරු සොඬින් ගෙන හුම්බස්තලයේ තියාගෙන පසුපස පැමිණියේ ය. ඇතාට වනාන්තරය කෙළවරේ නතර වෙන්නට සිදු වුණි. ඔහුගේ දෑසින් කඳුළු ගලා හැලෙද්දී බුදුන් වහන්සේ දෙසම බලා සිටින්නට විය. ඇතාගේ දර්ශන සීමාවෙන් බුදුරජාණන් වහන්සේ නො පෙනී යද්දී, ඇතාට දරාගත නොහැකි මාරාන්තික දරුණු ආබාධයක් ඇති විය. එම වේදනාවෙන් පාරිලෙය්‍ය හස්තීරාජයා මැරී වැටුණත්, මරණාසන්න මොහොතේ භාග්‍යවතුන් වහන්සේ ගැන තිබූ පැහැදීමේ කුසල මරණාසන්න චිත්ත වීථිය නිසා පාරිලෙය්‍යක ඇතාට දුගතියෙන් මිදී සුගතිය උරුම කර ගන්න භාග්‍යය ලැබුණි.



## බිරිඳ අතින් මැරුම් කෑ සැමියා

එක් බිරිඳක් සැමියා සමඟ සෙනෙහසින් ජීවත් විය. මෙම නිවසට සැමියාගේ බාල සහෝදරයා නිතර එන්නට විය. කාලයක් යන විට ඔහුගේ ඇසුර නිසා, ඔහුත් මැයත් සමඟ අනියම් බැඳීමක් ඇති විය. බිරිඳගේ යෝජනාවට මල්ලී තමන්ගේ අයියාව ඝාතනය කරන්නට සැලසුම් කළේ ය.

දිනක් වැඩට ගොස් පැමිණි සැමියා පිළිගත් බිරිඳ රාගය ඇවිස්සෙන ලෙස කථා කර, හිසේ නෙල්ලි කල්කයක් ගා නාන්න කියා තොටුපලට පිටත් කළේ ය. මල්ලීට ආයුධයක් ගෙන කල් ඇතිවම එහි සැඟවෙන්නට උපදෙස් දුන්නේ ය. අයියා පැමිණ නෙල්ලි කල්කය හිසේ ගා වතුරට නැමුණු මොහොතේ ම මල්ලී අයියාගේ බෙල්ල කපා මරණයට පත් කළේ ය. බිරිඳ ගැන රාගයෙන් ම සිතමින් සිටි අයියා එම නිවස ළඟම ගැරඬියෙක් වී ඉපදුණි. නිතර එම නිවසට යන්නට විය. මේ කාන්තාව ගැරඬියා ද මැරුවා ය.

ඔහු එම නිවසේ ම බැල්ලියගේ කුස බලු පැටියෙක් විය. ඇගේ පිටුපසින් ම යන එන නිසා ඇය මේ බල්ලා ද මැරුවා ය. ඉන්පසු එම නිවසේ ම වැස්සියගේ කුසේ ඉපදුණි. මේ වහු පැටියා ද ඇගේ පිටුපසින්ම යන එන නිසා ඌද මැරුවා ය. ඉන්පසුව එම සාංසාරික රාගය ටිකෙන් ටික අඩුවීමත් පෙර කුසල විපාකයක් මතු වීමත් නිසා මේ කාන්තාවගේ ම කුසේ මල්ලීට දාව ඉපදුණේ ය.

නමුත් මේ ළමයා මවු කිරි බොන්නට අකැමැති විය. ටිකෙන් ටික වැඩෙන විට මේ ළමයා පෙර භවයේ තමන්ව මැරුවේ මේ කාන්තාවයි ඒ නිසයි ඇයට අකැමැති කියා සීයාට කියා දෙදෙනාම ගොස් පැවිදිව රහත් විය.

තිරිසන් සතුන් සුගතියේ උපන් ආකාරය පෙන්නන්නට අභිධර්මය ශ්‍රවණය කළ කිරි වවුලන් පන්සිය දෙනා, මිගපෝතක වස්තුව ආදී ලෙස ජාතක කථා ද, චරිත කථා ද ඕනෑතරම් ගෙන හැර දැක්විය හැක. තිරිසන් සතෙක්ව ඉපදුණේ නැති කිසිදු දෙව් බ්‍රහ්මයෙක් නැත. සියල්ලෝම, සියලුම සත්වයෝම තිරිසන් සතුන්ව පමණක් නොව, සතර අපාගතවම සිට ඇත. ඒවායින් චුති ප්‍රතිසන්ධීන් සිදුවන ආකාරය ඔවුන් නොදන්නවාට අප කුමක් කරන්න ද? එය ඔවුන්ගේ මිථ්‍යා දෘෂ්ඨියේ තරම යි. එයට අපට කරන්නට දෙයක් නැත. අපට කළ හැක්කේ ඔවුන්ට කරුණු පෙන්වා දීමයි. එහෙත් ඔවුන් පිළි නොගන්නවා නම් ආශ්‍රයෙන් ඈත් කර තැබීම පමණි.

නාම රූප ඇසුරෙන් ද මෙයට කරුණු දක්වන්නෙමු. නරක, තිරිසන්, ප්‍රේත, අසුර කියා අපාය සතරක් තිබේ. මේ සතර අපායෙහි උපත ලබන පුද්ගලයින් හඳුන්වන්නේ දුගති අහේතුක පුද්ගලයින් ලෙසයි. මේ දුගති අහේතුකයින්ට සිත් 89 න් වීථි සිත් 37 ක් ලැබේ. ඒ තිස් හත නම්:-

අකුසල් සිත් 12. හසිතුප්පාදය හැර අහේතුක සිත් 17 යි. මහා කුසල් සිත් 08 යි යන සිත් තිස් හතම තිරිසන් සත්වයින්ට ලැබේ. මේ අයට නොලැබෙන්නේ හසිතුප්පාදයත්, කාමාවචර මහා ක්‍රියා අටත්, මහා විපාක සිත් අටත්, රූපාවචර කුසල ක්‍රියා දහයත්, අරූපාවචර කුසල ක්‍රියා අටත්, ලෝකෝත්තර සිත් අටත් යන සිත් 43 පමණි. මේවා සතර අපාගත සත්වයින්ට ම ලැබෙන්නේ නැත. මෙතන මහා කුසල් සිත් අට යැයි කී විට බණ ඇසීම ආදී සියලුම කුසලයන් කර ගත හැකි ය. නමුත් අටමහා කුසල සිත්වලට විපාක සිත් තිරිසන් භවයේ දී ලැබෙන්නේ නැත.

ඉතිරිය 09 පිටුවට ....

**මධුර ප්‍රභාත්**

# සසුනඹරට පෑයූ සුපුන් සඳ

## දෙවිනුවර සිරිසුනන්ද මහා යතිවරයාණෝ



**1923 මැයි මස 13 වැනි දින උපත ලැබූ උන්වහන්සේගේ දෙමාපියන් වූයේ, දෙවිනුවර සිංහාසන පාරේ, එම්.එච්. කරෝලිස් අප්පු මුදලාලි සහ එල්.එම් සංගෝහාමි මහත්මිය යි. එම පවුලේ කුළුදුල් දරුවා වූයේ, එම්.එච්. සිරිසේන දරුවා ය.**

අධ්‍යාපනයට යොමු කළ යුතු වයස සම්පූර්ණ වීමත් සමඟ සිරිසේන දරුවා දෙවිනුවර සරණපාල විදුහලට ඇතුළත් කළහ. එහි 06 වන වසර ඉගෙනීම් කරමින් සිටිය දී, එවකටත් පැවිදි දිවියකට ඇතුළත් ව ශාසනික සේවයක් කරමින් සිටි සිරිසේන කුමරුගේ සීයා ගේ අදහසක් අනුව සිරිසේන කුමරුට ද, ශාසනික සේවයක් ඉටු කිරීමට අවස්ථාව උදා විය.

එවකට දෙවිනුවර ප්‍රදේශයේ ප්‍රසිද්ධව සිටි දක්ෂ දෛවඥවරයෙක් සිරිසේන කුමරුගේ කේන්ද්‍ර පිටපත පරීක්ෂා කර ස්ථිර වශයෙන්ම මෙම කුමරු පැවිදි දිවියට ඇතුළත් කරන්නේ නම්, ඔහු සසුනඹර ඒකාලෝක කරන බව ප්‍රකාශ කරන ලදී. ඒ අනුව සිරිසේන කුමරු සුගතෝදය පිරිවෙනට ඇතුළත් කිරීමේ අදහසින් එහි විහාරාධිපතීත්වය ඉසිලූ කහඳමෝදර පියරතන හිමි වෙත භාර කළහ.

දෙමාපියන්ගේ සහ පැවිදිව සිටි සීයාගේ අදහස සම්පූර්ණ කරමින් සිරිසේන කුමරු 1934 ජුනි මස 07 වැනි දින පැවිදි දිවියට ඇතුළත් වූයේ, දෙවිනුවර සිරිසුනන්ද නමින් ඉහත සුගතෝදය පරිවේණාධිපතිවරුන් වහන්සේලාගේ ආචාර්යත්වයෙනි. පැවිදි දිවියට ඇතුළත්ව කෝට්ටේගොඩ සුගතෝදය මහ පිරිවෙනින් මූලික පිරිවෙන් අධ්‍යාපනය හදාරමින් සිටිය දී, ඒ බව දැනගත් එවකට දෙවිනුවර රාජමහා විහාරාධිපතිව සිටි දෙවිනුවර සිරිනිවාස හිමියෝ තමන්හට ශිෂ්‍ය රත්නයක අවශ්‍යතාව බලවත්ව පැවැතිය දී, තම ඥතීත්වය ද සලකා සුනන්ද සාමණේර හිමියෝ 1941 වෙසක් පොහොය දින විහාරස්ථානයට කැඳවා එහි නේවාසිකව වැඩ වසන ලෙස දන්වා සිටියහ. මේ වන විට සිරි සුනන්ද හිමියෝ උපසම්පදා ශිලය පිහිටවීමට අවශ්‍ය සියලු බණ දහම් සපුරා ඇති බැවින් 1943 ජුනි මස 23 වන දින දොඩන්දූව උපසම්පදා සීමා මාලකයේ දී, දෙවිනුවර සිරිනිවාස නායක හිමියන්ගේ ශිෂ්‍යයෙක් ලෙස උපසම්පදා ශීලයට ඇතුළත් විය.

එම උපසම්පදා ශිලයෙන් පසු දොඩන්දූව විහාරස්ථානයේ රැඳී සිටිමින් සමාජ සේවා සහ ආගමික කටයුතුවලට මුල් තැන දෙමින් දායකයන් සමඟ ප්‍රදේශයට අමතක නොවන සේවයක් ඉටු කළහ.

සිරිසුනන්ද හිමියන්ගේ කාර්යශූරත්වය ගැන දැනගත් එවකට සේරුවාවිල මංගල රාජ මහා විහාරාධිපතිව වැඩ විසූ දඹගස්ආරේ සිරි සුමේධංකර නා හිමියෝ උන්වහන්සේට එම විහාරස්ථානයට වැඩම කරවන ලෙස ඉල්ලා සිටියේ, එම දෙපාර්ශවයේ ම පරම්පරාගත ඥතීන් බැවිනි.

එම ඉල්ලීම පරිදි ගුරු හිමි දෙවිනුවර සිරිනිවාස හිමියන්ගේ අවසරය පරිදි 1950 ජුලි මස සේරුවාවිල මංගල රාජමහා විහාරස්ථානයට වැඩම කර එම ඓතිහාසික පින්බිම දායක කාරකාදීන් සමඟ කටුකොහොල් හරවා ඉතාමත් ආකර්ෂණීය ලෙස සකස් කළහ. මංගල රාජමහා විහාරස්ථානයට සැතපුම් 06 ක් පමණ දුරින් පිහිටි ඇල්ල ගොවි ව්‍යාපාරයට අයත් ගම්මාන කීපයක් එක් කර “සෝමපුර” නමින් නවතම ගම්මානයක් ද බිහිකර එය “සෝමපුර” නමින් රජයේ ලියාපදිංචිය ලබා ගැනීමට කටයුතු කළහ.

මේ කාලය තුළ දෙවිනුවර රාජමහා විහාරස්ථානයේ කටයුතු සඳහා ද ශිෂ්‍ය නමකගේ අවශ්‍යතාවඉතා තදින් වටහා ගත් එහි නාහිමියන් නැවත දෙවිනුවර රාජමහා විහාරස්ථානයට (පරම විචිත්‍රාරාම මහා විහාරස්ථානයට) වැඩම කරවන ලෙස දැනුම් දෙනු ලැබීය. ඒ අනුව දෙවිනුවරට වැඩම කළ සිරිනන්ද හිමියෝ එහි විහාරාධිපතීත්වය ඉසිලූ දෙවිනුවර සිරිනිවාස හිමියන්ගේ අපවත් වීමෙන් පසු 1963 දී එහි නායකත්වයට පත්විය.

1971 දී කල්‍යාණවංශික නිකායේ කාරක සංඝ සභික ධූරයට පත්ව 1974 දී තම සංඝ සභාව මගින් මාතර හම්බන්තොට දෙදිසාවේ උප ප්‍රධාන සංඝ නායක ධූරයෙන් ද සම්මාන ලබා 1978 දී “ශ්‍රී සරණපාල වංශාවතංසලංකාර වාගීස්වර” යන ගෞරව සම්මානය සහිතව අමරපුර කල්‍යාණවංශ මහ නිකායේ ප්‍රධාන සංඝනායක ධූරයට 1978 දී කල්‍යාණවංශ මහ නිකායේ ඒකමතික තීරණය අනුව පත්කර ගන්නා ලදී.

වර්ෂ 2001 ජුනි මස 23 වන දින අමෙරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියාවේ බෞද්ධ දර්ශනය පිළිබඳ සංඝ සභාව මඟින් උන්වහන්සේට “ආචාර්ය” යන ගෞරව සම්මාන උපාධියක් පුදනු ලැබීය.

මේ වන විට සිය ජීවන ගමනේ 100 වැනි සැතපුම් කණුවත් පැවිදි දිවියේ 90 වැනි වියත් පසු කරමින් සිටින අප කතා නායකයාණෝ තනතුරු පසුපස හඹා නො ගියහ. බුදුපියාණන් වහන්සේ වදාළ පරිදි සංඝ සෝභන ගුණ ගරුත්වය තුළ රැඳී සිටිති.

මේ වන විටත් යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් සිටින දායක කාරකාදීන්ගේ යුතුකම් ඉටු කරමින් අපේ නායක හිමියන් සියවසක් ඉක්මවා ගියත් සමාජයට හා ශාසනයට සේවය කිරීමට චිරාත් කාලයක් වැජඹේවා'යි ප්‍රාර්ථනා කරමි.

රාජ්‍ය සාහිත්‍ය කලා භූෂණ
**තලල්ලේ**
**ප්‍රඥරත්න විදානගමාච්චි**

## පිණ්ඩපාත චාරිකාවක්



***සම්බුදු තෙමඟුල සිහි කරමින් රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව දන්කොටුව ශාසනාරක්ෂක මණ්ඩලය හා දන්කොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්ව සංවිධානය කරන ලද පිණ්ඩපාත චාරිකාවක් පසුගිය 08 දින දන්කොටුව නගර මධ්‍යයේ දී පැවැත්වුණි. දන්කොටුව ධර්ම ප්‍රදීප බෞද්ධ මධ්‍යස්ථානයේ සිට භික්ෂූන් වහන්සේ හතළිස් නමක් පිණ්ඩපාත චාරිකාවෙහි වැඩියහ. මඟ දෙපස සිටි සැදැහැවතුන් ගෞරව පූර්වකව දන් පැන් පිළිගැන්වී ය.***

***එල්. කේ. ජේ. චතුරිකා - දන්කොටුව***

## තිරිසන් සතුන් බණ අසා ...

*08 පිටුවෙන් ...*

හසිතුප්පාදයත්. කාමාවචර මහා ක්‍රියා අටත් නොලැබෙන්නේ සතර අපාගත අය රහත් නොවන නිසා ය. මහා විපාක සිත් අට නොලැබෙන්නේ එයින් ලබා දිය යුතු සුගති සැප විපාක දුගතියෙහි ලැබූ උපත නිසා නොලැබෙන නිසා ය. රූපාවචර කුසල ක්‍රියා දහයත්, අරූපාවචර කුසල ක්‍රියා අටත් නොලැබෙන්නේ දුගති උපත නිසා ය. සතර අපාගත ඇත්තෝ මගඵල නොලබන නිසා ලෝකෝත්තර සිත් ලැබෙන්නේ ද නැත.

මිනිස් ලොව සිටින කෙනෙක් බොහෝ දානාදී පින්කම් කරගෙන සිටියත් මරණාසන්න කාලයේ දී මරණාසන්නයේ දී බොහෝ ලෝභ ජවන් ඇති වුවහොත් ඊළඟ භවයෙහි ප්‍රේත ලෝකයෙහි උපදී. ඒ ප්‍රේතයන් අතරිනුත් නිජ්ඣාමතණ්හිකාදී ප්‍රේතයන්ව උපදින අයගේ ප්‍රතිසන්ධිය උපෙක්ඛා සහගත අකුසල විපාක සන්තීරණ සිතින්ම අපායට ඇතුළත්ව හට ගනී. ඥාති ප්‍රේතයන්ව උපදින ප්‍රේතයන්ගේ ප්‍රතිසන්ධිය කුසල විපාක උපෙක්ඛා සහගත සන්තීරණ සිතින් චාතුර්මහාරාජිකයට ඇතුළත්ව හට ගනී. මරණාසන්න මොහොතේ ද්වේෂ මූලික ජවන් පහළ වූ විට ඊළඟ භවය අපායෙහි යම් තැනක ප්‍රතිසන්ධිය ලබයි. මරණාසන්න මොහොතේ මෝහ මූලික ජවන් පහළ වන සත්වයන් අතරින් බහුතරයක් බොහෝ විට ඊළඟ භවය තිරිසන් අපායෙහි ප්‍රතිසන්ධිය ලබයි. තිරිසන් සත්වයෙක්ව උපන් පසුව ඒ කෙනාගේ චිත්ත සන්තතිය “උපෙක්ඛා සහගත අකුසල විපාක සන්තීරණ සිතක්” වේ. ඒ කෙනාගේ ප්‍රතිසන්ධියත්, භවාංගයත්, චුතියත් එම සිත්ම වේ. එවැනි තත්වයක සිටින තිරිසන් සත්වයින්ට මනුෂ්‍ය දිව්‍ය සැප සම්පත් විඳින්නට සුදුසු හැකියාවක් තිරිසන් භවයෙන් මිදෙන තෙක් නැත. තිරිසන් භවයෙන් මිදී සුගති භවේ උපන් පසුව, පෙර සසරේ ද බලසම්පන්න කුසලයන්ගේ විපාක ලැබිය හැකි ය.

## වියානා බොදු සමුළුව මේ මස 12 වැනිදා

ප්‍රථම වරට පවත්වනු ලබන වියානා බෞද්ධ සමුළුව මේ මස 12 වැනිදා සිට 14 වෙනිදා දක්වා ඔස්ට්‍රියාවේ වියානා නගරයේදී පැවැත්වේ. යුරෝපයේ ශ්‍රී ලාංකික භික්ෂු සංගමය විසින් පවත්වනු ලබන මෙවර සමුළුවට රටවල් රැසකින් භික්ෂූන් වහන්සේ 50 නමක් පමණ සහභාගි වෙති.

ශ්‍රී ලංකා රජයේද විශේෂ අනුග්‍රහයක් යටතේ මෙරට භික්ෂූන් වහන්සේ එයට සහභාගි වීමට නියමිත අතර මෙහිදී මූලිකත්වය ගනු ලබන්නේ වියානා ඤාණපෝනික බෞද්ධ මධ්‍යස්ථානාධිපති මහාචාර්ය විජයරාජපුර සීලවංශ, ජර්මනියේ ශාක්‍යමුනි විහාරාධිපති රත්මලේ පුඤ්ඤරතන, රෝමයේ ශාක්‍යමුනි විහාරාධිපති ශාස්ත්‍රපති කටුවන සිද්ධත්ථ හිමි ඇතුළු මහා සංඝ රත්නය විසිනි.

යුරෝපාවාසීන් විසින් නිරුතුරුවම ථෙරවාද බෞද්ධ දර්ශනයට වඩා වැඩි අවධානයක් යොමු කිරීමත්, යුරෝපයේ ථෙරවාදී භික්ෂූන් වහන්සේ එක්ව කටයුතු කිරීමත් මෙහි අරමුණු අතර වේ. මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් මහාචාර්ය විජයරාජපුර සීලවංශ හිමි, ජර්මනියේ ශාක්‍යමුනි විහාරාධිපති රත්මලේ පුඤ්ඤරතන හිමි සහ රෝමයේ ශාක්‍යමුනි විහාරාධිපති ශාස්ත්‍රපති කටුවන සිද්ධත්ථ හිමි යන නා හිමිවරුන් පැවසුවේ මේ සමුළුවේ ප්‍රධාන අරමුණක් වන්නේ 50කට ආසන්නව ඇති යුරෝපයේ විහාරස්ථාන එකමුතුවක් ඇති කර ඒ හරහා මෙරට බුද්ධ ශාසනය රැක ගැනීම වෙනුවෙන් හා අත්‍යවශ්‍ය අවස්ථාවන්හිදී ඒ වෙනුවෙන් සහාය දැක්වීමට කටයුතු කරන බවයි.

එමෙන්ම යුරෝපයේ බුදු දහම ප්‍රචාරය කිරීමේ දී මතුවන ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමත් මෙරට කෙරෙහි බටහිර රටවල ඇති වැරැදි දැකීම් නිවැරැදි කිරීමටද මේ හරහා හැකිවනු ඇති බවට උන්වහන්සේ විශ්වාසය පළ කරති.

මෙම සමුළුවට යුරෝපාවාසී භික්ෂූන් වහන්සේට අමතරව මැලේසියාවේ ප්‍රධාන සංඝනායක මහා කරුණා පදනමේ අධ්‍යක්ෂ ජනරාල් බූටාවත්තේ සරණංකර නා හිමි හා සිංගප්පූරුවේ ප්‍රධාන සංඝනායක කරදෙටියන ගුණරතන නාහිමි ඇතුළු සෙසු රටවල් කිහිපයකද මහා සංඝරත්නය සහභාගි වෙති.

**තාරක වික්‍රමසේකර**



# ලෝ සත අවිදු අඳුරෙන් මුදාගත් අසහාය ධර්ම සන්නිවේදකයාණෝ

**බුදුන් වහන්සේ සන්නිවේදනයේ දී දන්නා දෙයින් නොදන්නා දේ අවබෝධ කරලීම සඳහා අනුගමනය කළ ක්‍රියාපටිපාටිය සඳහා අභය රාජ කුමාර සූත්‍රය අග්ගිවච්චගොත්ත සූත්‍රය, නිදසුන් වේ.**

ධර්ම සන්නිවේදනයේ දී බුදුන් වහන්සේ දක්ෂතා ඇති ශ්‍රාවකයන් වහන්සේ (සිව් පිරිසම) අගය කරමින් තනතුරු ප්‍රදානය කරමින් ගෞරවයට පත් කළහ. ධම්මචක්ක සූත්‍රයේ එන "අඤ්ඤාසි වත හෝ කොණ්ඩඤ්ඤෝ අඤ්ඤාසි වත හෝ කොණ්ඩඤ්ඤෝ හි යන ප්‍රකාශයෙන් ම පැහැදිලි වේ. අසූමහා චරිත කතා තුළින් ද එය පැහැදිලි වේ.

බුදුරජාණන් වහන්සේ ධර්ම සන්නිවේදනයේ දී ශ්‍රාවක සිත් වශීකෘත කරවූ දේශනා ක්‍රමවේදයක් ද අනුගමනය කළහ. එම දෙසුම අට ගුණයකින් යුතු බව මජ්ඣිම නිකායේ මහා සීහනාද සූත්‍රයේ දැක්වේ.

විස්සට්ඨතා - ශබ්දය පහසුවෙන් පිටවීම, විඤ්ඤෙය්‍යතා - අදහස වහා අවබෝධ වීම, මඤ්ජුතා - මිහිරි බව, ස්වණීයතා - සවනට සැප ගෙනදීම, බින්දුතා - අතර බිඳීම් නැති බව, අවසාරිතා - පැහැදිලි වීම, ගම්භීරතා - ගැඹුරු බව, හින්නාදිතා - පිරිස් කෙළවර සිටින අයට පවා ඇසීම යන අෂ්ටාංග සමුපේත බ්‍රහ්ම ස්වරයෙන් යුතු බුදුන් වහන්සේ කුරවී කොවුලන්ගේ හඬ පරදන කන් කලු මිහිරිතම හඬකින් යුක්ත වීම ද ධර්ම සන්නිවේදනයේ දී ශ්‍රාවක සිත ඇද බැඳ ගන්නට හේතු විය.

මේ ධර්ම සන්නිවේදනයේ දී කිසිවකුට හිංසාවක්, පීඩාවක්, අරාවුලක් පළිගැනීමක්, ලේ වගිරීමක් නොවූ අතර සන්සුන් බව, සැනසුණු බව ඇතිවේ. මෙවන් සන්නිවේදනයක් අද කාලයට අත්‍යවශ්‍යය වේ. මිනිස් සිත් නිවාලන සන්නිවේදන ක්‍රම අනුගමනය කිරීමට වර්තමාන මාධ්‍යකරුවන්ට මේ ධර්ම සන්නිවේදන ක්‍රම පූර්වාදර්ශයක් වේ.

බුදුන් වහන්සේ ශ්‍රාවකයාගේ චරිත ස්වභාවය, ඔවුන් පත්ව සිටින තත්ත්වය ඔවුන්ගේ ගතිගුණ ආකල්ප ආදිය මැනවින් වටහා ගෙන විවිධ උපාය මාර්ග අනුගමනය කරමින් ලෝකයේ යථාර්ථය ශ්‍රාවකයාට අවබෝධ කර ගැනීමට ඒ ධර්ම සන්නිවේදනය සිදුකළ බැවින් ශ්‍රාවකයන් එය උසස් කොට අගය කළ බව බොහෝ සූත්‍රවල අන්තයේ එන ප්‍රකාශයෙන් පැහැදිලි වේ.

අභික්කන්ත හෝ ගෞතම අභික්කන්නං හෝ ගෞතම, සෙය්‍යථාපී හෝ ගෝතම... ශ්‍රාවකයන් බුදුන් වහන්සේගේ දෙසුම් අසා මැනවින් සතුටට පත්ව

" මැනවි ස්වාමීනි, යටිකුරු කරන ලද්දේ උඩුකුරු කළා සේ, වසන ලද්ද විවර කළා සේ, මංමුලා වූවකුට මඟ හෙළි කළා සේ, ඇස් ඇත්තෝ රූප දකිත්වායි. අඳුරට ආලෝකයක් දුන්නා සේ අනේක පරියායෙන් ඔබ වහන්සේ අපට දහම් දෙසූ සේක."

අපමණ සතුටට පත් ශ්‍රාවකයන් මම මෙතැන් පටන් පළමුව, දෙවනුව, තෙවනුවත් ඔබ වහන්සේ සරණ යමි. බුදුන් වහන්සේ ඒ ධර්ම සන්නිවේදනයේ දී පිළිවෙළ කතාව (ආනුපුබ්බ කතා) දෙසූහ. දාන කථං සීල කථං සග්ග කථං කාමානං ආදිනවං ඕකාරං සං කිලෙසං නෙක්ඛමෙමච ආනිසංසං පකාසෙසි.

අංගුත්තර නිකායේ අට්ඨක නිපාතයේ සඳහන් පරිදි දන්දීම, සිල් රැකීම, ස්වර්ගයට යාම, කාමයේ ආදීනව, විවේකය, තපස ජීවිතයේ ඇති අනුසස් ක්‍රමයෙන් පෙන්වා දුන්හ. එවිට ශ්‍රාවකයා වේගයෙන් ඒ ධර්ම සන්නිවේදනයෙන් ධර්මයට බැස ගනී. ඒ තුළින් දීම, පරිත්‍යාගය, නිර්ලෝභී බව පරාර්ථය යහපත් ගතිගුණ සීලාදී වටිනාකම් අගයන්නට විය. ඒ අනුව බුදුන් වහන්සේ සන්නිවේදන කාර්යය සඵලත්වයට මඟ කීහ.

ධර්ම සන්නිවේදනයේ දී බුදුන් වහන්සේ ජනතාව ධෛර්යවත් කරන්නට, ඔවුන්ගේ ශාන්ත සන්සුන් බව ඇති කරන්නට, දහම් දෙසූහ.

"ආරභථ නික්ඛමථ යුඤ්ජථ බුද්ධසාසනේ - අරඹව් නික්මෙව් සසුනෙහි යෙදවේ."

අප්පමාදෝ අමතපදං පමාදෝ මච්චුනො පදං පරිනිර්වාණ මඤ්චකයේ දී ද ශ්‍රාවකයන්ට අවවාද කළේ,

වයධම්මා සංඛාරා

අප්පමාදේන සම්පාදේථ

අප්‍රමාදීව ක්‍රියා කරන්න. උට්ඨාන වීර්යයෙහි දෘඪතර වීර්යයෙහි අනුසස් කීහ. කුසීතකම, අලස බව බුදුන් වහන්සේ ගැරහූ අතර නිර්භීත බව ධෛර්යය අගය කළහ.

පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු චක්ඛුං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදී අලෝකෝ උදපාදි පෙර නොඇසූ විරූ ධර්මයන් දෙසූ බැවින් දහම් ඇස පහළ විය. නුවණ පහළ විය. විද්‍යාව පහළ විය. ප්‍රඥාව පහළ විය. ආලෝකය පහළ විය. මේ ධර්ම සන්නිවේදනයේ උපරිම තලයට ශ්‍රාවකයා ගෙන ඒම සඳහා මඟ කී ලොව අති දක්ෂ ධර්ම සන්නිවේදකයන් වහන්සේ වනුයේ බුදුරජාණන් වහන්සේ ය.



තෙල්ලඹුර ශ්‍රී පුෂ්පාරාම විහාරාධිපති
උඩුමලගල ශ්‍රී ආදිච්චවංස පරිවේණාධිපති
යක්කලමුල්ල ශාසනාරක්ෂක බලමණ්ඩලයේ
ලේඛකාධිකාරී කීර්ති ශ්‍රී ශාස්ත්‍රපති

**පලල්ලේ සරණජෝති හිමි**

## සියලු සංස්කාර ...

*02 පිටුවෙන් ...*

"ආනන්ද බුදු සසුනෙහි ශාස්තෘවරයකු නැතැයි කිසිවිටෙකත් නොසිතන්න. මා විසින් දේශනා කරන ලද ධර්ම විනය දෙක මගේ ඇවෑමෙන් තොපගේ ශාස්තෘවරයා වන්නේ ය." ඉක්බිතිව භික්ෂූන් අමතා "මහණෙනි, තුණුරුවන් පිළිබඳ සැකයක් ඇතොත් දැන්ම විමසා දැනගන්න. තථාගතයන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් නොවිචාරා සිටින්නහු නම් යහළුවන් මඟින් විචාරා දැන ගන්නැයි වදාළහ.

අවසාන වශයෙන් බුදුරජාණන් වහන්සේ භික්ෂූන් අමතා "හන්දදානි භික්ඛවෙ ආමන්තයාමි. වො වයධම්මා සංඛාරා අප්පමාදේන සම්පාදේථ"

මහණෙනි මම දැන් ඔබ අමතමි. සියලු සංස්කාර ධර්ම නැසෙන සුළුයි. නොපමාව කුසල් දහම්හි යෙදෙන්න." මෙය අන්තිම බුද්ධ වචනයයි.

තථාගතයන් වහන්සේගේ පිරිනිවන් පෑම රහත් නොවූ භික්ෂූන් වහන්සේට දරාගත නොහැකි තරම් ශෝකදායක සිද්ධියක් විය. රහතන් වහන්සේලා සියලු සංස්කාර ධර්ම අනිත්‍යය යැයි පවසමින් ධර්ම සංවේග උපදවා ගත්හ.

පසුදින උදෑසන අනුරුද්ධ රහතන් වහන්සේගේ උපදෙස් පරිදි ආනන්ද තෙරණුවෝ කුසිනාරා නුවර මල්ල රජ දරුවන් වෙතට ගොස් තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑමේ ඛේදජනක ප්‍රවෘත්තිය දන්වා සිටියහ.

වෙසක් සඳ කෙමෙන් කෙමෙන් අවරට යමින් පැවතිණි. උපවත්තන සල් උයන පුරාම වූයේ ශෝකය හා සංවේගය මුසු පරිසරයකි. අකලට පිපී පෙදෙසම වර්ණවත් හා සුගන්ධවත් කළ සල්මල් එක දෙක බිම පතිත වූයේ අනිත්‍යතාව පිළිබඳ පාඩම් පොතේ පත් ඉරු එකින් එක දිග හරින්නාක් මෙනි. බුදුරජාණන් වහන්සේ අවසාන වරට ධ්‍යානවලට සමවදිමින් සැතපී සිටියහ. නොරහත් භික්ෂූන් වහන්සේ ඒදෙස බලා සිටියේ දුක් සෝසුසුම් හෙළමිනි.

සංස්කාර ධර්මයන්ගේ ස්වභාවය මෙනෙහි කරමින් ධර්ම සංවේගය උපදවා ගත් රහතන් වහන්සේලා නිසලව බලා සිටියහ. පන්සාළිස් වසරකට පෙර තුන් ලොවම එළිය කරමින් උදා වූ සම්බුදු වෙසක් සඳ තවත් වසර දහස් ගණනක් පුරා පැතිර යන ආලෝකයක් ඉතිරි කරමින් බැස යන මොහොත උදා විය.

මෛත්‍රී ජලයෙන් තුන් ලොවම සිසිල් කළ දහම් අමා වැස්සෙන් කෙලෙස් ගිනි නිවාලු මහා කාරුණික වූ, අසරණ සරණ වූ අප තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ඒ වෙසක් පුර පසළොස්වක් පොහෝදා අලුයම් කාලයේ දී පිරිනිවන් පා වදාළහ. එකෙනෙහි ම මහ පොළොව කම්පා වූයේ තථාගත පරිනිර්වාණය මුළු ලොවට දැනුම් දීමට මෙනි. මල්ල රජ දරුවන්ගේ සංවිධායකත්වයෙන් තථාගත ශරීරයට විවිධ පූජෝපහාර පැවැත්විණි.

ආදාහන කටයුතු සංවිධානය වූයේ සක්විති රජ කෙනකුගේ ආදාහනයක් මෙනි. දෙව් මිනිස්, බඹ, සුර නරන්ගේ පූජෝපහාර මැද මකුටබන්ධන නම් ස්ථානයේ ඉදිකරන ලද සඳුන් දර සෑයක. මේ මහා භද්‍ර කල්පයේ හතරවන සම්මා සම්බුදුරදුන් ලෙස පහළ වූ ගෞතම තථාගත ශ්‍රී දේහය ආදාහනය කළහ. මෝදු වූ වෙසක් සුපුන් සඳ අවරදිග අහස් තලයෙන් බැස ගියේ ය.

# නොදියුණු බව අභිබවා ...

06 පිටුවෙන් ...

වර්ණ භේදයකින් තොරව කර්මවල ඵල විපාක ලැබෙන බව බුදු දහම අවධාරණය කරයි. මෙය මානව සංහතියේ ඒකත්වය පිළිබඳ දක්වන ආචාර විද්‍යාත්මක තර්කයකි. වරක් බුදුන් වහන්සේ මධුර රජතුමාට ප්‍රකාශ කරනුයේ මෙලොව ක්ෂත්‍රීයෙක්, බමුණෙක්, වෛශ්‍යයෙක්, ශුද්‍රයෙක් කාමයේ වරදවා හැසිරෙනුයේ, මුසාබස් බණනුයේ, පිසුණු බස් ඇතියේ, පරොස් බස් ඇතියේ, හිස් බස් ඇතියේ අභිධ්‍යා බහුල වුයේ, ව්‍යාපාද සිත් ඇත්තේ, මිසදිටු ඇත්තේ වේ ද, ඔහු මරණින් මතු සැපයෙන් පහ වූ දුගතියේ උපදනා බවයි.

එසේ ම මෙකී කුල සතරෙහි යමෙක් මෙම අකුසල ධර්මයන්ගෙන් වෙන් වුයේ සුගතියෙහි උපදනා බව ය. මේ අනුව කුලය මෙහි තීරණාත්මක සාධකයක් වී නොමැත.

බ්‍රාහ්මණ සමාජ දර්ශනය තුළ කුලවාදය මුල් බැසගෙන තිබූ ආකාරයත්, ඉන් පහත් යැයි සම්මත කුලයන් පීඩනයට ලක් වූ ආකාරයත් ඒසුකාරී නම් බමුණකු බුදුන් වහන්සේට ඉදිරිපත් කළ බ්‍රාහ්මණ සංකල්පයක් තුළින් ප්‍රකට වේ.

ඒසුකාරී බමුණා බුදුන් වහන්සේ වෙත පැමිණ බ්‍රාහ්මණයන්ට කුල සතරම මෙහෙ කටයුතු ය. ක්ෂත්‍රියන්ට බමුණු කුලය හැර සෙසු කුල තුන ද, වෛශ්‍යයන්ට ක්ෂත්‍රීය බ්‍රාහ්මණ දෙකුලය හැර සෙසු කුල දෙක, ශුද්‍රයන්ට ශුද්‍ර කුලය ද මෙහෙ කටයුතු ය යනුවෙන් මතයක් පවත්නා බව ප්‍රකාශ කොට මේ පිළිබඳ බුදුන් වහන්සේගේ අදහස විමසීය.

එහි දී බුදුන් වහන්සේ බමුණන්ගේ මෙකී පැණවීම හුදෙක් පුද්ගලයාගේ කැමැත්ත අකැමැත්ත නො විමසා බලහත් කාරයෙන් පවරනු ලබන්නෙකැයි වදාරා තමන් වහන්සේ සියලු පරිචර්යාවන් කළ යුතු යැයි ද, නොකළ යුතු යැයි ද ප්‍රකාශ නොකරන බවත්, පරිචර්යා කිරීමෙන් ඔහුට යහපතක් වන්නේ නම්, පාපයක් නොවන්නේ නම් එබඳු පරිචර්යා කළ යුතු යැයි ද, නො එසේනම් නොකළ යුතු යැයි ද අවධාරනය කළහ.

අනතුරුව ඒසුකාරී බමුණා බමුණන් අතර පවත්නා තවත් එවැනිම වූ පිළිගැනීමක් පිළිබඳ ප්‍රකාශ කොට එහිදී ද බුදුන් වහන්සේගේ මතය විමසීය.

එනම්, බ්‍රාහ්මණයෝ ධන සතරක් පනවත්. ඒ ධන ඉක්මවන්නා නොදුන් දෙය ගන්නා ගෝපකයකු මෙන් නොකොටයුත්තක් කෙරේ.

කුලය අනුව ඔවුන්ට අයත් වන ඒ ධන සතර නම් දුනු හී ක්ෂත්‍රීයන්ට අයත් ස්වකීය ධනය යි. බ්‍රාහ්මණයාට භික්ෂාටනය යි. වෛශ්‍යයාට ගොවිතැන වෙළඳාම හා ගව පාලනය යි. ශුද්‍රයාට අයත් ස්වකීය ධනය නම් තණ කපන දෑකැත්ත හා කදයි.

බමුණන්ගේ මේ සතර ධනයන් සියලු ලෝකයා පිළිගනී දැයි ප්‍රකාශ කළ බුදුන් වහන්සේ පුද්ගලයාගේ කැමැත්ත අකැමැත්ත නොමැතිව පනවන ලද මෙකී පැනවීම ද බලහත්කාරකමකැයි දක්වා ආර්ය වූ ලෝකෝත්තර ධර්මය පුද්ගලයාගේ ස්වකීය ධනය වශයෙන් පෙන්වා දුන්හ.

අනතුරුව කුල ව්‍යවහාර පිළිබඳ බුදුන් වහන්සේ අදහස් දක්වමින් ඒසුකාරී බ්‍රාහ්මණයාට ප්‍රකාශ කළේ පැරැණි වූ මවුපියන් සතු වංශය සිහි කරන පුද්ගලයාගේ ආත්ම භාවය යම් යම් කුල වංශයක ඉපදීම වේ ද ඒ අනුව ව්‍යවහාරයට එන බවයි.

ක්ෂත්‍රීය කුලයෙහි ආත්මභාවයක ඉපදුනේ නම් ක්ෂත්‍රීය යැයි ව්‍යවහාරයට පැමිණේ. බමුණු වෛශ්‍ය ශුද්‍ර කුලය ද එසේ ම ය. මෙකී කුලවල කවරකු හෝ ප්‍රාණ ඝාතයෙන් වැළකී, අබ්‍රහ්මචර්යාවෙන් වැළකී, බොරුකීමෙන් වැළකී, පිසුණු බසින් වැළකී, පරොස් බසින් වැළකී, අභිධ්‍යා බහුල නොවී, අව්‍යාපාද සිතින් යුක්තව, සම්මා දිට්ඨියෙන් යුක්තව කුසල ධර්මයෙහි පිහිටා ද ඒ සැමට ආධ්‍යාත්මික සුවය ලද හැකි යැයි පෙන්වා දුන්හ.

බමුණා ගඟට ගොස් නා ශරීරයේ කුණු ඉවත් කරන්නාක් මෙන් සෙසු සියලු කුලවලට ද ආධ්‍යාත්මික සුවය ලද හැකි යැයි මානව සංහතියේ ඒකත්වය ප්‍රකට කළහ. මෙයින් පැහැදිලි වන්නේ බුදු දහම පුද්ගලයාගේ ශ්‍රේෂ්ඨත්වය අගය කරනුයේ ආචාරාත්මක පදනමකින් මිස ජන්මීය පදනමකින් නොවන බවයි.

තමො තම පරායන සුත්‍රයේ දී බ්‍රාහ්මණ සමාජයේ කුල වාදය අනුව කොටස් සතරක් විය. එහෙත් බුදුරජාණන් වහන්සේ එය අන් ලෙසකින් ඉදිරිපත් කළහ. තමොතම පරායන සුත්‍රයේ දී පුද්ගලයෝ සතර දෙනෙක් ඉදිරිපත් කළහ.

තමො තම පරායනො, තමො ජොති පරායනො, ජොති තම පරායනො, ජාති ජොති පරායනො වශයෙනි.

වර්ණය අනුව වෛදික සාමජයේ බෙදීම් සිදු වූ අතර බෞද්ධ සමාජයේ ආලෝකය අනුව බෙදා ඇත. මෙසේ බලන විට බෞද්ධ සමාජ දර්ශනය ගෘහත්මක සමාජ දර්ශනයක් බව පැහැදිලි වෙයි.

හොඳ අය නරක් විය හැකිවාක් මෙන් නරක අය හොඳ විය හැකි අතර , හොඳ අය වඩාත් හොඳ අය විය හැකි වීමයි. මේ අනුව හොඳ - නරක වශයෙන් දෙකොටසකට පමණක් බෙදා නැත. එයින් පුද්ගලයා අඳුරෙන් ආලෝකයට කැඳවුනු ලබයි.

ජාතිය කුලය වැනි සංකල්ප මත පදනම්ව පුද්ගලයාගේ වර්ගීකරණය නොකර බුදු සමය ආධ්‍යාත්මික හෝ ආචාරාත්මක සංවර්ධනයේ ප්‍රමාණය අනුව කිසියම් වර්ග කිරීමක් කරනු ලබයි. වසල සුත්‍රයේ දී පුද්ගලයා උසස් වන්නේ ඔහුගේ ක්‍රියාකාරිත්වය අනුව බව දක්වා තිබේ. ගිහි පැවිදි, සෝවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් වශයෙන් ද දක්වා ලැබෙන වර්ගීකරණය තුළ ද ඇත්තේ මෙකී පදනමයි. මෙම වර්ගීකරණය කිසිලෙසකින්වත් බ්‍රාහ්මණ චින්තනය හා සමගාමී නොවේ. ඊට හේතුව බුදු සමය නිරතුරුව ම පුද්ගලයා පහත් තත්ත්වයෙන් උසස් තත්ත්වය කරා යෑමට අනුබල දීමත්, ඊට අදාළ පසුබිම ඕනෑම පුද්ගලයකුට විවර කර දීමත් නිසාවෙනි.

ආධ්‍යාත්මික වශයෙන් හෝ ආචාරාත්මක වශයෙන් නොදියුණු (පහත්) පුද්ගලයකු එසේ සිටිය යුතු නොවේ. එය අභිබවා යා යුතු යැයි අවධාරණය කරන බුදුදහම සියලු පුද්ගලයන් උසස් පුද්ගලයන් බවට පත්වීම අපේක්ෂා කරයි. බමුණු මවගෙන් උපන් පමණකින් කෙනකු බමුණකු නොවන බව අවධාරනය කරන බුදු දහම කෙලෙස් නැති, දැඩි සේ ගැනීම් නැති සියලු සංයෝජන සිඳ දැමූ, සිල්වත් වූ, ක්‍රෝධයෙන් තොර ආදී ආධ්‍යාත්මික සංවර්ධනයෙන් යුත් පුද්ගලයා බමුණකු වශයෙන් හඳුන්වා දී තිබේ.

# දියුණුවේ දොරටු අරිනවාද? වසනවාද? ...

05 පිටුවෙන් ...

සිඟාලෝවාද සුත්‍රයෙහි ධනය විනාශයට පත්වන කරුණු සය අතර නොකල්හි වීථි සංචාරය ද ධන විනාශ මුඛයකි. අවේලාවේ නුසුදුසු කල වීථීන්හි තැනින් තැන ඇවිදීම නොකළ යුත්තකි. හේතුවක් නොමැතිව මඟතොට ඇවිදීම කාලය කා දැමීමකි. අපතේ යැවීමකි. අවේලාවේ රස්තියාදුවේ යෙදීමෙන් බොහෝ කරදරවලට මුහුණපාන්නට සිදුවෙයි.

ඇති කරදර දුරු කර ගෙන සැප සේ වාසය කරනවා වෙනුවට නැති කරදර ළං කර ගැනීම අඥානයාගේ ගතියකි.

අපගේ ජීවිතය රැකබලා ගැනීම ආරක්ෂා කර ගැනීම අප විසින් ම කළ යුතු ය. නැතහොත් නැති කරදර ප්‍රශ්න අප වෙත ළං වෙයි. මෙලොව ගැන කල්පනා නොකොට සිතා නොබලා නිකරුණේ මඟතොට ඇවිදීමෙන් අපගේ ජීවිතය අනාරක්ෂිත වෙයි. බාහිර උපද්‍රවයන්ට ලක් වී දුක් විඳීමට සිදුවෙයි. යම් තැනැත්තෙක් නොකල්හි වීථිවල සැරිසැරීමෙන් ඔහුගේ අඹුදරුවන්ගේ ආරක්ෂාව ද නැතිවෙයි.

හොඳ ස්වාමිපුරුෂයෝ නිතරම තම බිරිඳට දරුවන්ට මනා රැකවරණය සලසයි. මෙසේ මඟ ඇවිදීමෙන් එම යුතුකම ඉටු නොවෙයි. කෙනෙක් වේලාව අවේලාව නොබලා මඟ ඇවිදීමට යාමෙන් තමාගේ ද, තම අඹුදරුවන්ගේ ද පමණක් නොව තමා දුක සේ ඉපයූ වස්තුව ද ආරක්ෂාවෙන් තොරවෙයි. අනාරක්ෂිත වෙයි.

එපමණක් නොව ඔහු වැරැදි ක්‍රියාවලට සැක කටයුතු තැනැත්තෙක් වෙයි. අවේලාවේ තැන්තැන්වල ඇවිදීමට යාමෙන් වැරැදි ක්‍රියාවලට සැකකරුවකු වෙයි.

අවේලාවේ මහ මඟ සැරිසරන්නා ගැන අභූත දෝෂ කථා ද ඇතිවෙයි.

නොකල්හි මෙලෙස මඟ හැසිරෙන්නාට බොහෝ දුක් කරදරවලට මුහුණ පෑමට ද සිදුවෙයි.

යම් තැනැත්තෙක් මෙලෙස අවේලාවේ වීථි සංචාරය කරයි ද එය නැති දුක් කරදර ළං කර ගැනීමකි. ඉන් ඔහු ද ඔහුගේ අඹු දරුවන් ද ඔහු සන්තක දේපළ වස්තුව ද බොහෝ උපද්‍රවයනට ලක්වේ.

මෙලෙස බොහෝ දුක් හිරිහැර ගෙන දෙන අවේලාවේ වීථිවල හැසිරීමෙන් වැළකී සිටිමු.

උත්සව දර්ශනාදියෙහි ලොල්වීම ද ධන විනාශ මුඛයෙකි. එහි දොස් සයක් ඇති බව බුදුපියාණෝ වදාළ සේක.

නැටුම්, ගැයුම්, වැයුම් අසන්නට, බලන්නට විනෝදවීමට නැටුම් දර්ශනාදිය ඇති උත්සවපළවල හැසිරීම පුද්ගලයාගේ ධනය විනාශයට පමුණුවයි. ඇතැමුන් නැටුම් ගයුම්, වැයුම් ඇති උත්සව තැන් සොය සොයා එහි ආස්වාදයට හුරුවූවෝ වෙති. ඉන් ඔවුහු රන් සදිසි වටිනා කාලය ද තම ධනය ද විනාශ කර ගනිති.

තම දියුණුව සිතන පතන ඊට වැඩ කරන නුවණැත්තා නැටුම් ගැයුම් උත්සව දර්ශනාදියෙහි ලොල් නොවී ඉන් වැළකී තම දියුණුව සාදා ගනියි.

අප රටේ ද ඇතැම් දෙනා නාට්‍ය දර්ශන චිත්‍රපට ආදියට ලොල්වී නාට්‍යාංගනාවන්ගේ නැටුම්, ගැයුම්, වැයුම් දකින්නට, බලන්නට, අසන්නට රැඟුම් ශාලා වෙත ඇදෙති. විනෝදාස්වාද ලබමින් පසිඳුරන් පිනවීමට ලොල්වීමෙන් නැති කර ගන්නා ධන සම්භාරය සුළුපටු නොවේ. තරුණයන් පමණක් නොව ඇතැම් විලිබිය නැති කාන්තාවෝ ද රාත්‍රී සමාජ ශාලා වෙත ඇදෙති. අපේ මේ දහම් දිවයිනේ බොහෝ දෙනකු පිරිහීමට පත් වී ඇති අයුරු ඉන් පිළිබිඹු වෙයි.

දූ කෙළියෙහි යෙදීම ද කෙනකුගේ භෝග විනාශ මුඛ කරුණු සයෙන් එකකි. විනෝදය පිණිස ද? තණ්හාවෙන් ද? තම ධනය වැඩි කර ගැනීමේ අදහසින් ද බොහෝ අය සූදුවෙහි නිරත වෙති. දූ කෙළියෙහි, සූදුවේ වරක් දෙකක් යෙදුණේ නිතර නිතර දූ කෙළිති. ඊට පුරුදු වූවෝ නොපැකිළෙති. ඉක්මනින් සූදුවෙන් පොහොසත් වෙමි'යි සිතා කෙනෙක් දූ කෙළියෙහි යෙදෙති. ඉන් වරක් දෙකක් ජය ලැබුව ද ඒ මුදල් සූදුවට යෙදවීමට සූදුවට බර වූ කෙනා ක්‍රියා කරයි. අවසානයේ ඔහු තම උපභෝග, පරිභෝග සම්පත් ද අහිමි කර ගනී. පවුලේ දුක් කරදර වැඩි කර ගනියි. තමා සතුව තිබූ වස්තු සම්පත් නැති කරගෙන තමා ද දුකට වැටෙයි. තම අඹුදරුවන් ද දුකට පමුණුවයි.

පව්කම්හි නිරත වන පව්කාරයන් හා ඇසුරට යන්නා ද පිරිහෙයි. ඔහුගේ ධනය විනාශයට පත්වේ. පවිටු මිතුරන් යනු කවරහුද? කෙනෙක් දූ කෙළියෙහි යෙදෙන්නේ ද? එවැන්නකු හා ආශ්‍රය කරන්නාගේ ද ධනය නැති වෙයි.

ගැහැනුන් කෙරෙහි ලොල්වූවන් ද ඇසුරට නුසුදුසු ය. සුරාවේ ඇලී ගැලී සිටින්නා ද ඇසුරට නොගත යුතු ය. කපටි කෛරාටිකකම් කරන්නා ද ඇසුරින් බැහැර කළ යුතු ය. වංචා ප්‍රයෝග කරන්නා ද, මංකොල්ලකෑම්, බියවැද්දීම් යන සැහැසිකම් (යෙ සාහසිකා) කරන්නවුන් ද යනාදි වශයෙන් මෙසේ ඉහතින් දැක්වූ පවිටු මිතුරන් ඇසුරින් බැහැර නොකළ හොත් එය ධන විනාශ මුඛයකට හේතුවන බව සිඟාල කුල පුත්‍රයාට තථාගත බුදුපියාණන් වහන්සේ උගන්වා වදාළහ.

නරක, වැරැදි වැඩ කරන අය නිසා දුකට පත්වන, අමාරුවේ වැටෙන අය බොහෝ වෙති. කාලයේ වෙනසකින් තොරව පවිටු මිතුරු ඇසුර සැම කල්හිම අයහපත ම ගෙන දෙයි. එදා දේවදත්ත සමාගමය නිසා පවිටු ඇසුරින් අජාසත්ත ආදීන්ට අපා දොරටු විවර වූයේ ය.

ධූර්තයෝ, සූදුව ද, සල්ලාලකම කරන්නෝ එම දුරාචාර ක්‍රියා ද, බේබද්දෝ තම බේබදුකම, අනෙකාට ද බෝ කරති. හුරු කරවති. පසුව ඔහුගේ හොඳ හිතවතා සගයා වනුයේ තමන් හා දුරාචාරයේ පවතින්නා ය. ඒ නිසා මනා සිහියෙන් නුවණ මෙහෙයවා ධූර්තයන්,සල්ලාලයන්, බේබද්දන්, සමඟ ද රැවටිලිකරුවන්, වංචනිකයන් හා සාහසිකයන් ද ඇසුරින් දුරු කොට මේ වංචාකාරයෙක් ය. රැවටිලිකාරයෙක් ය යනාදි වශයෙන් අවබෝධ කරගෙන මනාව සෙවිලි කළ වහලය අව්වෙන්, වැස්සෙන් නිවසක නිවැසියන් රැක ගන්නා සේ, තමාගේ සිත හා නුවණ යොදා මෙවැනි පවිටු මිතුරන්ගෙන් බේරී ක්‍රියා නොකළහොත් එය තමාගේ ධනය විනාශ වී යාමට හේතුවක් වෙයි. ධන විනාශය නොපතන අය සිඟාලට බුදුරදුන් දුන් මේ උපදෙස තරයේ සිහි තබා හැසිරෙති.